# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දේශීය ආදායම් (සංශෝධන)

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින්
2021 මාර්තු මස 26 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 මාර්තු මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[41 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 112.00** **තැපැල් ගාස්තුව : රු. 45.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආදායම් බද්ද ගණනය කිරීමේ දී පාරිතෝෂික අරමුදලක් සඳහා සේවායෝජකයකු විසින් කරනු ලබන දායක මුදල් බැහැර කිරීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු නිදහස් කිරීම් ප්‍රදානය කිරීම වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මූල්‍ය ආයතනවල ණය පිරිවැය, අවසර දිය හැකි වියදමක් ලෙස සැලකීම වේ.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආදායම් බද්ද ගණනය කිරීමේ දී අලුත්වැඩියා කිරීමේ වියදම අඩුකිරීමට ඉඩදීම වේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් අඩුකිරීමක් ලෙස සැලකීම සඳහා ඉඩදීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සමාගමක මූල්‍ය පිරිවැය ගණනය කිරීම සරල කිරීම වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක හිලව් නොකළ පාඩු අඩු කිරීමක් ලෙස සැලකීම සඳහා ඉඩ ලබා දීම වේ.

*12 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් භාරයකට හෝ සමාගමකට තම ගිණුම් වර්ෂය වෙනස් කිරීම සඳහා හැකියාව ලබා දීම වේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ව්‍යාපාර වත්කම්වල පිරිවැය සහ ප්‍රතිෂ්ඨාව වෙන් කිරීම සඳහා ඉඩ ලබා දීම වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් වත්කමක් උපලබ්ධි කිරීමෙන් පසු උපචිත වන ලැබීම් සහ ලාභ මත බද්ද ගණනය කිරීම සරල කිරීම වේ.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ හවුල් ව්‍යාපාර ආදායම් බදු ගණනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ හවුල් ව්‍යාපාර බදු ගෙවීම මත ඇතැම් ආපසු ගෙවීම් සඳහා අවසර ලබා නොදීම වේ.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ව්‍යාපාර කටයුතු සඳහා බදු අයකිරීමේ පදනමක් සකස් කිරීම වේ.

*18 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් අනේවාසික තැනැත්තකු විසින් ප්‍රේෂණය කරනු ලබන ලාභ මත බදු නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම වේ.

*19 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

*20 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*21 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*22 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*23 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*24 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*25 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*26 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සේවානියුක්ති ආදායම මත බදු රඳවා ගැනීම අහෝසි කිරීම වේ.

*27 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (APIT) හඳුන්වා දීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියට 83අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

*28 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ලොතරැයි දිනුම්, ත්‍යාග, ආදිය මඟින් වූ මුදල් හැර, ආයෝජන ප්‍රතිලාභ මත බද්ද රඳවා ගැනීම අවලංගු කිරීම වේ.

*29 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් අත්තිකාරම් ආදායම් බදු (AIT) හඳුන්වාදීමට ප්‍රධාන ප්‍රඥප්තියට 84අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***30 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එහි නීතිය බලපෑම වන්නේ වාසිකයන්ට ගෙවන ලද සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගාස්තු මත බද්ද රඳවා ගැනීම ඉවත් කිරීම වේ.

***31 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***32 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***33 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***34 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ මාසික පදනම මත ප්‍රාග්ධන ලාභ බදු වාර්තා ගොනු කිරීමට නියම කිරීම වේ.

***35 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ සේවා නියුක්තිකයන් සඳහා ආදායම් බදු වාර්තා ගොනු කිරීම අනිවාර්ය බවට නියම කිරීම වේ.

***36 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***37 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ බද්දට අදාළ සියලු ලියවිලිවල බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය භාවිතා කිරීමට නියම කිරීම වේ.

***38 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ඉලෙක්ට්‍රොනිකව වාර්තා ගොනු කිරීමට සමාගම්වලට නියම කිරීම වේ.

***39 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ බදු ගෙවන්නාට වෙන් වෙන් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට නියම කිරීම වේ.

***40 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***41 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ඒ වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

***42 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ඒ වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

***43 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ඒ වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

***44 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***45 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ පොලිය ගණනය කිරීම සඳහා වූ කාල සීමාව දීර්ඝ කිරීම වේ.

***46 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***47 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් විගණකවරුන් ආදී තැනැත්තන්ට අදාළ දණ්ඩන විධිවිධාන හඳුන්වා දීමට ප්‍රධාන ප්‍රඥප්තියට 190අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***48 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ඇතැම් අලුත් අර්ථ නිරූපනයන් සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***49 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ හයවන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීම වේ.

***50 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***51 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීමට එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***52 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීමට එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***53 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීමට එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***54 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීමට එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***55 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීමට එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***56 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයේ විෂය පථය පුළුල් කිරීමට එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***57 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ආදායම් බදු ගණනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ නිකුත් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට බලය ප්‍රදානය කරනු ලැබේ.

***58 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් පශ්චාත් COVID -19 ආර්ථික ප්‍රගතිය උදෙසා පහසුකම් සැලැස්වීමට බදු සහන දීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

***59 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද ඇතැම් සංශෝධන අතීතයට බලපාන පරිදි විධිවිධාන සලස්වනු ලැබේ.

***60 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් දැනටමත් රැස් කරන ලද ආදායම් බදුවල වලංගුභාවය සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

## දේශීය ආදායම් (සංශෝධන)

එල්.ඩී.—ඕ 10/2020

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2021 අංක       දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) (මේ සංශෝධන පනතේ දක්වා ඇති 'අ' වගුවේ සහ 'ආ' වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන හැර) මේ පනතේ විධිවිධාන, කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දින සිට ආරම්භ විය යුතු ය.

(3) මේ සංශෝධන පනතේ දක්වා ඇති 'අ' වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන, 2021 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ සංශෝධන පනතේ දක්වා ඇති 'ආ' වගුවේ සඳහන් වගන්තිවල විධිවිධාන, ඒ වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති අදාළ දිනවල දී ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

2017 අංක 24 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "සියලු පූර්ණ කාලීන" යන වචන වෙනුවට "අදාළ සේවයේ එකම ශ්‍රේණියේ සියලු පූර්ණ කාලීන" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ අරමුදලක හෝ අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ සමිතියක" යන වචන වෙනුවට "අර්ථසාධක, පාරිතෝෂික හෝ ඉතිරි කිරීමේ අරමුදලක හෝ ඉතිරි කිරීමේ සමිතියක" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ "මේ පනතේ දෙවන හෝ හතරවන උපලේඛනය මඟින්" යන වචන වෙනුවට "මේ පනතේ හතරවන උපලේඛනය මඟින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "ගිවිසුමකට (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම වෙනුවට, "ගිවිසුමකට හෝ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත කරන ලද යම් ව්‍යාපෘතිවලට (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (v) වන අනුඡේදයේ "අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ අරමුදලකට" යන වචන වෙනුවට "අර්ථසාධක, පාරිතෝෂික හෝ ඉතිරි කිරීමේ අරමුදලකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.*

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "(4) මේ වගන්තියේ කාර්යය සඳහා, තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සංකල්පය (TVET සංකල්පය) යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව යම් පුද්ගලයකු විසින් 2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරන ලද අලුත් ව්‍යාපාර සඳහා සපයන ලද ණය වෙනුවෙන් මූල්‍ය ආයතන විසින් දරන ලද අරමුදල්වල පිරිවැය, ඒ මූල්‍ය ආයතන විසින් ආදායම ලබා ගැනීමේ දී දරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම*

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) "තක්සේරු වර්ෂයක් සඳහා ප්‍රදානය කරන ලද (1) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම්-" යන වචන සහ ඉලක්කම වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ප්‍රදානය කරන ලද (1) වන උපවගන්තියේ සඳහන් වැඩි දියුණු කිරීමේ වියදම් අඩු කිරීම්-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ "කරනු ලබන අලුත්වැඩියාවක් හෝ වැඩි දියුණු කිරීමක්" යන වචන වෙනුවට "කරනු ලබන වැඩි දියුණු කිරීමක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "(හතරවන උපලේඛනයේ 3 වන ඡේදය)." යන වචන සහ ඉලක්කම වෙනුවට "(හතරවන උපලේඛනයේ 3 වන ඡේදය)." යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) මේ වගන්තියේ "වැඩි දියුණු කිරීම" යන්නෙන්, ක්ෂය විය හැකි වත්කමකට, ඒ වත්කමේ වටිනාකම වැඩිවන ලෙස එකතු කිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරීමට යම් තැනැත්තකු විසින් දරන ලද වියදම් අදහස් වන නමුත්, ක්ෂය විය හැකි වත්කමකට ඒ වත්කමේ වටිනාකම තාවකාලිකව වැඩිවන නඩත්තු කිරීමක් හෝ අලුත්වැඩියා කිරීමක් සඳහා දරන ලද වියදම ඇතුළත් නොවේ.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 15අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː- ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් 15අ. (1) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ව්‍යාපාරයකින් යම් තැනැත්තකු ලබන ආදායම

ගණනය කිරීමේ දී, තක්සේරු වර්ෂය තුළ දී ආදායම් උත්පාදනය කිරීමේ දී ඒ තැනැත්තා විසින් දරන ලද අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වුව ද, එසේ නොවුව ද, අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ "අලෙවිකරණ සහ සන්නිවේදන වියදම්" යන්නෙන්, යම් තැනැත්තකු විසින්-

(අ) ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකාවේ යම් ආයතනයක් විසින් සිදු කරනු ලබන වෙළඳපළ පර්යේෂණවල දී;

(ආ) අලෙවිකරණය, වෙළඳ ප්‍රචාරණය සහ සන්නිවේදන වැඩසටහන් සැලසුම් කිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද වියදම්, ඒ සැලසුම් කිරීම හෝ නිෂ්පාදනය කිරීම ශ්‍රී ලංකාව තුළ සිදු කරන තාක් දුරට;

(ඇ) රූපවාහිනී, ගුවන් විදුලි, මුද්‍රිත හෝ එළිමහන් වෙළෙඳ ප්‍රචාරණය ඇතුළු ප්‍රධාන පෙළේ මාධ්‍යවල සහ සමාජ මාධ්‍යවල කරන ප්‍රචාරණයේ දී;

(ඈ) ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් දේශීය ආයතනයක් විසින් සිදු කරනු ලබන, නිෂ්පාදන දියත් කිරීම් හෝ ප්‍රචාරණ වැඩසටහන් සක්‍රීය කිරීමේ දී;

(ඉ) ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් දේශීය ආයතනයක් විසින් විකුණුම් ස්ථාන ද්‍රව්‍ය සංවර්ධනයේ දී සහ මුද්‍රණයේ දී,

දරන ලද යම් වියදම් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "මේ පනතේ දෙවන හෝ හතරවන උපලේඛනයේ" යන වචන වෙනුවට "මේ පනතේ දෙවන, හතරවන හෝ හයවන උපලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "මේ පනතේ දෙවන හෝ හතරවන උපලේඛනවල" යන වචන වෙනුවට "මේ පනතේ හතරවන උපලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සහ තක්සේරු වර්ෂය අවසාන වන දිනයේ දී නිකුත් කළ ප්‍රාග්ධනයක් සහිත (මූල්‍ය ආයතනයක් නොවන) සමාගමක ආදායම ගණනය කිරීමේ දී අඩුකරනු ලබන මූල්‍ය පිරිවැය ප්‍රමාණය (2) වන උපවගන්තියේ සඳහන් සීමාව නොඉක්මවිය යුතු ය.

(2) ඒ සීමාව පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබිය යුතු යː-

$$\frac{A}{B} \times C$$

මෙම සූත්‍රයෙහි-

'A' = වර්ෂය තුළ මූල්‍ය පිරිවැය;

'B' = වර්ෂය තුළ මූල්‍ය පිරිවැය දරන ලද මූල්‍ය සාධන පත්‍රවල වටිනාකම; සහ

'C' = 4 X වර්ෂය අවසානයේ දී සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව, වේ.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩුකරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

"නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩු කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා, යම් සමාගමකට ඒ සමාගම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් ලෙස ක්‍රියාත්මක වූ කාලසීමාව තුළ ඒ ව්‍යාපාරයෙන් සිදු වූ හිලව් නොකළ පාඩුවක් පවත්නා වර්ෂයේ දී අඩු කිරීමට ඇති අවස්ථාවක සහ-

(අ) ඒ හිලව් නොකළ පාඩුව, එය දරනු ලැබූ තක්සේරු වර්ෂය තුළ ලාභයක් වී නම් සහ එම ලාභය මත අඩු අනුප්‍රමාණයක් අනුව බදු අය කරනු ලබයි නම්; සහ

(ආ) පවත්නා වර්ෂයේ ව්‍යාපාර ආදායමෙන් (අ) ඡේදයේ සඳහන් වර්ෂය තුළ දී මෙන් එම අඩු අනුප්‍රමාණය අනුව බදු අය කළ නොහැකි නම්,

ඒ හිලව් නොකළ පාඩුව, ((1) වන උපවගන්තියේ (ආ) ඡේදයට යටත්ව) පවත්නා වර්ෂයේ ඒ අනුප්‍රමාණය ම මත (එය බදු අයකළ හැකි ලාභයක් විය හැකිව තිබුණේ නම්) බදු අයකළ හැකි පාඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) භාරයකට හෝ සමාගමකට (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි තක්සේරු වර්ෂයේ මාස දොළහක කාලසීමාව සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ

භාරය හෝ සමාගම විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම සඳහා විකල්ප මාස දොළහක කාලසීමාවක් මත පදනම් වූ ගිණුම් භාවිත කිරීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය. කොමසාරිස් ජනරාල්වරයා විසින්, සුදුසු යයි ඔහු විසින් සලකන යම් නියම හා කොන්දේසි මත ඒ ඉල්ලීම අනුමත කරනු ලැබිය හැකි ය. ඒ භාරය හෝ සමාගම ඒ අනුමතයට අදාළ යම් නියමවලට සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අනුමතය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් භාරයක හෝ සමාගමක තක්සේරු වර්ෂය" යන වචනවල සිට ඒ උපවගන්තිය අවසානය තෙක් ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "(2) වන උපවගන්තිය යටතේ අනුමතය ලත් වෙනස් කිරීමක් මඟින් එම භාරය හෝ සමාගම විසින් වාරික මඟින් සහ VIII වන පරිච්ඡේදය යටතේ තක්සේරු කිරීම් මත බද්ද ගෙවිය යුතු අවස්ථාව වෙනස් වීමේ ප්‍රතිඵලය ඇති නො වන්නේ ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"තක්සේරු වර්ෂය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම

"(5) 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී යම් තැනැත්තකුට අයත් යම් වත්කමක්, වෙනස් අනුප්‍රමාණවලින් බදු අයකළ හැකි ව්‍යාපාරවලින් (අලාභ ද ඇතුළත්ව) විවිධ ලැබීම් සහ ලාභ උත්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක, වත්කම සඳහා ලද පිරිවැය සහ ප්‍රතිෂ්ඨාව ඒ අදාළ ලැබීම් සහ ලාභ උත්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන වත්කම්වල කොටස්වල වෙළඳපළ අගය අනුව ඒ ලැබීම් සහ ලාභ අතර බෙදා වෙන් කරනු ලැබිය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1අ) (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකුගේ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීම වෙනුවෙන් ලැබෙන ප්‍රතිෂ්ඨාව, ඒ වත්කම උපලබ්ධි කරන අවස්ථාවේ දී ඒ වත්කම වෙනුවෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබිය හැකි මුදල හෝ තක්සේරු කරන ලද වටිනාකම යන දෙකෙන් වඩා ඉහළ අගය විය යුතු ය:

එසේ වුව ද, තක්සේරු කරන ලද වටිනාකමෙන් ඒ වත්කමේ වෙළඳපළ වටිනාකම නිරූපණය නොවන බව බදු නිලධරයකුගේ මතය වන්නේ නම්, ඒ බදු නිලධරයා විසින් (1) වන උපවගන්තිය ප්‍රකාරව වත්කමක් සඳහා ලැබුණු ප්‍රතිෂ්ඨාව නිශ්චය කරනු ලැබිය හැකි ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා, "තක්සේරු කරන ලද වටිනාකම" යන්නෙන්, වෘත්තීය සුදුසුකම්ලත් තක්සේරුකරුවකු විසින් තක්සේරු වාර්තාවකින් සහතික කරන ලද, උපලබ්ධි කරන අවස්ථාවේ දී පැවති වටිනාකම අදහස් වේ.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් හවුල් ව්‍යාපාරයක්" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව යම් හවුල් ව්‍යාපාරයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) සෑම හවුල් ව්‍යාපාරයක් ම, 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි එහි හවුල්කරුවන්ගෙන් වෙන්ව, මේ පනතේ පළමුවන උපලේඛනයේ 2 වන ඡේදයේ දක්වා ඇති අනුප්‍රමාණය අනුව ආදායම් බද්ද ගෙවීමට යටත් විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ "ප්‍රමුඛ හවුල්කරු" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව, ප්‍රමුඛ හවුල්කරු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(10) මේ පනත මගින් හවුල් ව්‍යාපාරය මත එහි ආදායම් බද්ද ගෙවීමට අදාළව පනවන ලද යම් කාර්යයක් හෝ වගකීමක් ඉටු කිරීම සඳහා හවුල් ව්‍යාපාරයක එක් එක් හවුල්කරු වගකිව යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "ලැබිය යුතු අතර, ඔවුන් විසින්" යන වචන වෙනුවට "ලැබිය යුතු අතර, ඒ හවුල්කරුට ආරෝපණය කළ යුතු යම් බදු කොටසක යම් අතිරික්තයක් ආපසු ලබා ගැනීමට කිසිදු අයිතියක් නොමැතිව (එහෙත් පසුව එළඹෙන වර්ෂයේ දී, බදු බැරක් ලෙස අඩු කිරීම පිණිස ඒ වර්ෂයට ඉදිරියට ගෙන යාමේ අයිතිය ඇතිව) ඔවුන් විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "සමාගමක සියලු ව්‍යාපාර කටයුතු," යන වචන වෙනුවට "විවිධ ක්‍රියාකාරකම් සහ ආදායම් මූලාශ්‍ර සඳහා විවිධ බදු අනුප්‍රමාණ අදාළ කරගන්නේ නම් මිස, සහ එවිට ඒ එක් එක් ක්‍රියාකාරකම සහ මූලාශ්‍රය වෙනම ව්‍යාපාර සහ මූලාශ්‍ර ලෙස සලකනු ලැබිය යුතු වීම හැර, සමාගමක සියලු ව්‍යාපාර කටයුතු," යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වගන්තිය සංශෝධනය කිරීම

"කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය:

එසේ වුව ද, නිර්වාසික පුද්ගලයකු විසින් 2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී උපයාගත් මුළු ආදායම, ඒ ආදායම උපයාගත් තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙන් ආරම්භ වන වසර තුනක අවම කාලසීමාවක් ශ්‍රී ලංකාව තුළ රඳවා ගෙන, එය ස්වකීය ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා හෝ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවෙන් කොටස් හෝ සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ යම් භාණ්ඩාගාර බිල්පතක්, භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරයක් අත්කර ගැනීමට ආයෝජනය කරන්නේ නම් ඒ ආයෝජනය කරන ලද රඳවාගත් ආදායම ප්‍රේෂණය කිරීම මත බදු අනුප්‍රමාණය ශුන්‍යය විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “එම ප්‍රතිපාදන අඩු නොකළ යුතු ය.” යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“එම ප්‍රතිපාදන අඩු නොකළ යුතු ය:

එසේ වුව ද, අඩුකිරීමක් ලෙස කලින් ඉඩ දී ඇති ණය හිමිකමක් වෙනුවෙන් වූ නිශ්චිත ප්‍රතිපාදනය වර්ෂය තුළ දී සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ප්‍රත්‍යාවර්තනය කරනු ලබන අඩු කරනු ලැබ හෝ ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, එසේ ප්‍රත්‍යාවර්තනය කරන ලද, අඩුකරන ලද හෝ ගෙවන ලද මුදල ඒ තැනැත්තාගේ ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කරනු ලැබිය යුතු ය.”;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(3) බැංකු ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තකු විසින්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක සඳහන් කර ඇති පරිදි පිළියෙළ කිරීමට නියම කර ඇති

වාර්තා, ගිණුම් හෝ වෙනත් යම් ලේඛනවලට අමතරව, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකෘතියකින්, ණය හිමිකමක් වෙනුවෙන් වූ නිශ්චිත ප්‍රතිපාදන සම්බන්ධයෙන් වාර්තා පිළියෙළ කර රඳවා ගනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) මේ වගන්තියේ-

(අ) "බැංකු ව්‍යාපාරය" යන්නෙන්, මූල්‍ය ආයතනයක බැංකු ව්‍යාපාරය අදහස් වේ;

(ආ) "ණය හිමිකම" යන්නට, තැන්පතු, ණයකර, කොටස්, භාණ්ඩාගාර බිල්පත්, පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත් සහ බැඳුම්කර මත ගෙවීමක් ලැබීමට ඇති අයිතිය ඇතුළත් නොවේ;

(ඇ) "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද විධාන" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1988 අංක 30 දරන බැංකු පනතේ 76ඒ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බොල් ණය සහ අඩමාණ ණය සම්බන්ධයෙන් ඒ ඒ තක්සේරු වර්ෂයට අදාළ වන විශේෂ විධිවිධාන සැලසීමට නිකුත් කරන ලද යම් විධාන අදහස් වන නමුත්, ඊට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියෝග ඇතුළත් නොවේ.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම*

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මුදල් මත සියයට තුනක අතිරේක බද්දක්" යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණයෙන් සියයට තුනක් මත වූ අතිරේක බද්දක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම*

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "69 වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "69 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම*

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) (අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ වෙනත් යම් දේශයක ආණ්ඩුව අතර හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ වෙනත් යම් දේශවල ආණ්ඩු අතර ඇතිකර ගනු ලැබූ යම් ද්විත්ව බදුකරණ ගිවිසුමක් හෝ අන්‍යෝන්‍ය පරිපාලන සහාය ගිවිසුමක් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයෙන් අනුමත කරන අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ගිවිසුමට ශ්‍රී ලංකාව තුළ නෛතික බලය තිබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ඒ සෑම යෝජනා සම්මතයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ වෙනත් යම් දේශයක ආණ්ඩුව අතර ගිවිසගත් සහ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 70 වන වගන්තියේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 82 වන වගන්තියේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 92 වන වගන්තියේ හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ නීතියේ බලාත්මකභාවය ඇති සෑම ගිවිසුමක් ම සියලු කාර්ය සඳහා මේ උපවගන්තියේ

(අ) ඡේදය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ගිවිසුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ, "ද්විත්ව බදුකරණ ගිවිසුම" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා සහ රාජ්‍ය මූල්‍ය පැහැර හැරීම් වැළැක්වීමට අදාළ ජාත්‍යන්තර ගිවිසුමක්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ආදායම් බද්දට අදාළව සහ අනෙක් රටෙහි නීතිය මගින් පනවන ලද සමාන ස්වභාවයක යම් බදුවලට අදාළව ද්විත්ව බදුකරණයෙන් සහනය ලබා දීමේ සහ රාජ්‍ය මූල්‍ය පැහැර හැරීම් වැළැක්වීමේ කාර්යය සඳහා වන ජාත්‍යන්තර ගිවිසුමක්" යන වචන ආදේශ කිරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) "ස්ථිර ආයතනය" යන්නෙන්, ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධයෙන් වන ගිවිසුමකට එළැඹ ඇත්තේ යම් රටක් සම්බන්ධයෙන් ද එම රටට අදාළව වන විට, ශ්‍රී ලංකා රජය ද ශ්‍රී ලංකාවේ වාසික වන යම් තැනැත්තකු සහ එහි අනුයෝජිත ආයතන, ශාඛා හෝ ආයතන ඇත්තේ යම් භූමි ප්‍රදේශයක ද එම භූමි ප්‍රදේශයේ රජය ද අතර ගිවිසුමක් බලාත්මකව පවතින අවස්ථාවක, ද්විත්ව බදු සහන සඳහා වන ගිවිසුමක නිර්වචනය කර ඇති ස්ථිර ආයතනයක් අදහස් වේ;";

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "එහි ශ්‍රී ලංකාවේ" යන වචන වෙනුවට "එහි ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "(2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේද" යන වචන සහ ඉලක්කම වෙනුවට "(3) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ-

(i) "අඩු කොට හෝ වැඩි කොට-" යන වචන වෙනුවට"අඩු කොට, වැඩි කොට හෝ අවලංගු කොට-" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) ඒ ඡේදයේ (i) වන සහ (ii) වන අයිතම ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්:-

"(i) කමිටුවේ සියලුම සාමාජිකයන් එකඟ වන අවස්ථාවක දී, අවසාන නියෝගයක්; හෝ

(ii) කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරයක් එකඟ වන අවස්ථාවක දී, අතුරු නියෝගයක්,";

(ඇ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ "යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු විසින්" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ "යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුට" යන වචන වෙනුවට "යම් තැනැත්තකුට" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "(2) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම වෙනුවට "(3) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ (ii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ii) කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරයක් එකඟ වන වෙනත් යම් අවස්ථානුගත කරුණුවල දී, අතුරු නියෝගයක්,";

(ආ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ "එම තැනැත්තා වෙත හෝ එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරු වෙත" යන වචන වෙනුවට "එම තැනැත්තා වෙත" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "ගනුදෙනුවක දී මෙන්" යන වචන වෙනුවට "පාලිත ගනුදෙනුවක දී මෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "පැවරුම් මිල පිළිබඳ නිලධරයා විසින් හෝ සහකාර කොමසාරිස්වරයා විසින් කරන ලද" යන වචන වෙනුවට " තාක්ෂණික සමාලෝචන කමිටුව විසින් කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "බද්ද රඳවා ගනු ලැබිය යුතු" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව බද්ද රඳවා ගනු ලැබිය යුතු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 83අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 83අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද

83අ. (1) සේවායෝජකයකු විසින්, ඔහුගේ සේවානියුක්තයකුට කරන ලද 5 වන වගන්තිය යටතට ගැනෙන යම් ගෙවීමක් මත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි, ඒ සේවානියුක්තයා-

(අ) නිර්වාසික වේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම්; හෝ

(ආ) වාසිකයකු සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම් හා ස්වකීය කැමැත්ත ලබා දේ නම්,

2020 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බද්ද රඳවා ගැනීම සඳහා වන සේවායෝජකයකුගේ බැඳීම-

(අ) ගෙවන මුදලෙන් වෙනත් යම් ප්‍රමාණයක් අඩු කිරීමට සහ රඳවා ගැනීමට සේවායෝජකයාට අයිතිවාසිකමක් ඇති විට දී හෝ ඒ සඳහා ඔහු බැඳීමකට යටත්ව ඇති විට දී; හෝ

(ආ) සේවානියුක්තයකුට සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම අඩු නොකළ යුතු බවට හෝ බැඳීමකට යටත් නොවිය යුතු බවට වෙනත් යම් නීතියකින් විධිවිධාන සලසා ඇති විට දී,

අඩු වීම හෝ අවසන් වීම සිදු නොවිය යුතු ය.

(3) මේ පනත යටතේ රඳවා ගැනීමේ බද්දට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දට අදාළ විය යුතු අතර, මේ පනතේ ඒ යම් විධිවිධානයක " රඳවා ගැනීම", "රඳවා ගැනීමේ බද්ද" හෝ "රඳවා ගැනීම මඟින් ගෙවිය යුතු බද්ද" යන්නට ඇති සෑම

සඳහනක් ම, අවශ්‍ය වෙනස් කිරීම්වලට යටත්ව, "අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද" ට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "විශ්‍රාම ගෙවීමක් හෝ ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් ලද දිනුම් ලෙස මුදල් ප්‍රමාණයක් ගෙවන අවස්ථාවක; හෝ" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"විශ්‍රාම ගෙවීමක් 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ගෙවන අවස්ථාවක; හෝ";

(2) ඒ ඡේදයේ (i) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ii) ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් ලද දිනුම් ලෙස මුදල් ප්‍රමාණයක් ගෙවන අවස්ථාවක; හෝ";

(3) ඒ ඡේදයේ (ii) වන අනුඡේදය, ඒ ඡේදයේ (iii) වන අනුඡේදය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(4) ඒ ඡේදයේ නැවත අංකනය කරන ලද (iii) වන අනුඡේදයේ, "අදාළ කොටස" යන වචන වෙනුවට "අදාළ කොටස 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 84අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 84අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"අත්තිකාරම් ආදායම් බද්ද

84අ. (1) 83අ වගන්තියට සහ 84 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, 2020 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, ශ්‍රී ලංකාව තුළ වාසිකව සිටින බදු ගෙවන්නකු විසින්, ලාභාංශයක්, පොලියක්, වට්ටමක්, ගාස්තුවක්, ස්වාභාවික සම්පත් ගෙවීමක්, කුලියක්, රාජ්‍ය භාගයක්, වාරික මුදලක්

හෝ, ගෙවීම හෝ වෙන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් ඇති ඊට සමාන වාරිකමය ගෙවීමකින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන ලෙසට රඳවා ගැනීමේ අනුයෝජිතයකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ ඉල්ලීම ලැබුණු පසු, රඳවාගැනීමේ අනුයෝජිතයකු විසින්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ රඳවා ගැනීමේ බද්දට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අත්තිකාරම් ආදායම් බද්දට අදාළ විය යුතු අතර, මේ පනතේ ඒ යම් විධිවිධානයක, "රඳවා ගැනීම", "රඳවා ගැනීමේ බද්ද" හෝ "රඳවා ගැනීම මගින් ගෙවිය යුතු බද්ද" යන්නට ඇති සෑම සඳහනක් ම, අවශ්‍ය වෙනස් කිරීම්වලට යටත්ව, "අත්තිකාරම් ආදායම් බද්ද"ට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "එම තැනැත්තා-" යන වචන වෙනුවට "එම තැනැත්තා 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, යම් තැනැත්තකු විසින් නිර්වාසික තැනැත්තකුට ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් ලාභාංශයක්, පොලියක්, වට්ටමක්, ගාස්තුවක්, ස්වාභාවික සම්පත් ගෙවීමක්, කුලියක්, රාජ්‍යභාගයක්, වාරික මුදලක්, සේවා ගාස්තුවක් හෝ රක්ෂණ වාරික මුදලක් ගෙවනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් මේ පනතේ

පළමුවන උපලේඛනයේ 10 වන ඡේදයේ සඳහන් අනුප්‍රමාණය මත බද්ද රඳවා ගනු ලැබිය යුතු ය.”; සහ

(3) ඒ වගන්තියේ පැති සටහනේ “සේවා ගාස්තුවලින් සහ කොන්ත්‍රාත් ගෙවීම්වලින්” යන වචන වෙනුවට, “සේවා ගාස්තුවලින්, කොන්ත්‍රාත් ගෙවීම්වලින් සහ නිර්වාසික තැනැත්තන් වෙත කරන ගෙවීම්වලින්” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ “එම වසරේ” යන වචන වෙනුවට “පසුව එළඹෙන වර්ෂයේ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) “මේ පනතේ කාර්ය සඳහා,” යන වචන වෙනුවට “මේ පනතේ කාර්ය සඳහා 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ “84 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය” යන වචන සහ ඉලක්කම් වෙනුවට “84 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(1අ) මේ පනතේ කාර්ය සඳහා, 2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව අවසාන රඳවා ගැනීමේ ගෙවීම් පහත පරිදි විය යුතු යः-

(අ) ඔට්ටු ඇල්ලීම හෝ සූදුවලින් සමන්විත ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී ලද මුදල් ප්‍රමාණ හැර, ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් දිනුම් ලෙස ගෙවන ලද මුදල් ප්‍රමාණ;

(ආ) ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා උපයන ලද ගෙවීම් හැර, මෙම කාණ්ඩය යටතේ රඳවා ගැනීමට යටත් වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන නිර්වාසික තැනැත්තකුට හෝ නිර්වාසික අස්තිත්වයකට කරන ලද ගෙවීම්; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන නිර්වාසික පුද්ගලයකුට ගෙවන ලද හෝ ඒ පුද්ගලයා විසින් උපයන ලද ලෙසට සලකනු ලබන පොලිය:

එසේ වුව ද, පහත දැක්වෙන පොලී මුදල් ප්‍රමාණ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් නිර්වාසික පුද්ගලයකුට කරන ලද අවසාන රඳවා ගැනීමේ ගෙවීම් ලෙස සලකනු නොලැබිය යුතු යඃ-

(i) ගෙවන ලද සහ මේ පනතේ පස්වන උපලේඛනයේ 2(අ) ඡේදයේ සහන සීමාවට ඇතුළත් වන යම් පොලී මුදලක්; හෝ

(ii) වෙනත් මූලාශ්‍රවලින් වන තක්සේරු කළහැකි ආදායම්වල එකතුව සහන සීමාව නොඉක්මවන්නේ නම්, ඒ සහන සීමාවෙන් වෙනත් මූලාශ්‍රවලින් වන තක්සේරු කළ හැකි ආදායම්වල එකතුව (පොලිය හැර තක්සේරු කළ හැකි ආදායම්වල එකතුව) අඩු කරමින් ගණනය කළ යම් මුදලක්.";

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "(84 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(84 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ව්‍යාපාරයකින් හෝ ආයෝජනයකින්, හෝ" යන වචන වෙනුවට "ව්‍යාපාරයකින්, ආයෝජනයකින් හෝ වෙනත් ආදායමකින්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) වාරික ගෙවන්නකු විසින්, තක්සේරු වර්ෂය සඳහා වූ බදු වාරික, ඒ තක්සේරු වර්ෂයේ පිළිවෙළින් අගෝස්තු, නොවැම්බර් සහ පෙබරවාරි යන මාසවල පහළොස්වන දින හෝ ඊට පෙර ද, පසුව එළඹෙන තක්සේරු වර්ෂයේ මැයි මස පහළොස්වන දින හෝ ඊට පෙර ද, ගෙවිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "එකතුව වේ." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එකතුව වේ:

එසේ වුව ද, වාරික ගෙවන්නකු විසින් ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද ගණනය කිරීමේ දී, තක්සේරු වර්ෂය සඳහා සේවායෝජකයකු විසින් අඩු කරන ලද හෝ සේවායෝජකයකු විසින් අඩු කරනු ලැබිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද, මේ උපවගන්තියේ සඳහන් සූත්‍රය අදාළ කර ගැනීමට පෙරාතුව අඩු කරනු ලැබිය හැකි ය.";

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "හිමිකම් ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"හිමිකම් ලැබිය යුතු ය. 55 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, (එහෙත් ආපසු ගෙවීමක් සඳහා කිසිදු හිමිකමක් නොමැතිව) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු විසින් ගෙවනු ලැබ ඇති බවට සලකනු ලබන බදු බැර ප්‍රමාණයේ කොටස සඳහා හවුල්කරු විසින් ගෙවිය යුතු වර්තමාන බදු වාරිකය ගණනය කිරීමේ දී, හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ඒ වාරිකය ගෙවීමට යටත්ව, හවුල්කරුට බදු බැර මුදලක් සඳහා හිමිකම් ලැබිය යුතු ය.".

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ "ව්‍යාපාරයෙන් සහ ආයෝජනයෙන්" යන වචන වෙනුවට "ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් සහ වෙනත් ආදායම්වලින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමෙන් ලබන ලැබීමක් ඇතුළත් බදු අය කළ හැකි ආදායමක් සහිත සෑම තැනැත්තකු ම, ඒ උපලබ්ධි කිරීම සිදු වූ අදාළ ලිත් මාසය අවසන් වී දින තිහක කාලයක් ඇතුළත ප්‍රාග්ධන ලාභ බදු වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කළ යුතු ය.".

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "83 වන වගන්තිය යටතේ රඳවා ගැනීමට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය යටතේ 2019 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව රඳවා ගැනීමට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කිරීම

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තියේ "ස්වයං තක්සේරුවක් වන්නේ ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ස්වයං තක්සේරුවක් වන්නේ ය:

එසේ වුව ද, 93 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් වාර්තාවක් ගොනු කිරීමට නියම කරනු ලැබ ඇති ස්වයං තක්සේරු බදු ගෙවන්නකු විසින් තක්සේරු වර්ෂයක් තුළ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමෙන් ලැබුණු හෝ උපයන ලද යම් ලැබීමකට අදාළව ගොනු කරන ලද ප්‍රාග්ධන ලාභ බදු වාර්තා මගින් ඒ තක්සේරු වර්ෂය සඳහා ස්වයං තක්සේරුවක් ඇති නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ලිපි ගනුදෙනුවල දී භාවිත" යන වචන වෙනුවට "ලිපි ගනුදෙනුවල දී සහ බදු ගෙවන්නාගේ සියලු බදුවලට අදාළ මූලාශ්‍ර ලේඛනවල හෝ අනෙකුත් ලේඛනවල භාවිත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "පනත යටතේ" යන වචන වෙනුවට "(1අ) උපවගන්තියට යටත්ව, පනත යටතේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් ස්වකීය බදු වාර්තා පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංගයක් භාවිත කිරීම මඟින් ඉලෙක්ට්‍රොනිකව පමණක් ගොනු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි යම් තැනැත්තකු ව්‍යාපාරයක හෝ ආයෝජන කටයුත්තක නියැලී සිටින අවස්ථාවක දී සහ අවස්ථාවෝචිත පරිදි, ඒ ව්‍යාපාරයෙන් හෝ ආයෝජන කටයුත්තෙන් ලැබෙන ලැබීම්වලින් සහ ලාභවලින් වූ බදු අය කළ හැකි ආදායම් කොටස සඳහා විවිධ බදු අනුප්‍රමාණ අදාළ කරගනිමින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කළ යුතු අවස්ථාවක දී, හෝ නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ තිබිය හැකි අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් බදු අය කළ හැකි ආදායමේ එක් එක් කොටසට එක් එක් ආදායම් බදු අනුප්‍රමාණය අදාළ කර ගැනීමේ දී, ලැබීම් සහ ලාභවලින් වූ බදු අය කළ හැකි ආදායමේ කොටස හෝ නිදහස් කරන ලද ලැබීම් සහ ලාභ වෙන් වෙන්ව හඳුනාගැනීමට මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "තැනැත්තකු විසින් ප්‍රදානයක් වෙනුවෙන් බදු වාර්තාවක් හෝ බදු වාර්තාවක කොටසක් සකස් කර ඇති අවස්ථාවක දී" යන වචන වෙනුවට, "තැනැත්තකු විසින් ගෙවීමක් වෙනුවෙන් බදු වාර්තාවක් හෝ බදු වාර්තාවක කොටසක් සකස් කර ඇති, පුරවා ඇති හෝ සකස් කිරීමට හෝ පිරවීමට සහාය දී ඇති අවස්ථාවක දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "මේ පනතේ වාර්තා සම්බන්ධයෙන් වන විධිවිධාන මේ පනත යටතේ තමාගේ බදු බැඳීම පිළිබඳව හැර වෙනත් කාරණා පිළිබඳව තොරතුරු වාර්තා ගොනු කිරීමට" යන වචන වෙනුවට "මේ පනතේ වාර්තා, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා සම්බන්ධයෙන් වන විධිවිධාන

මේ පනත යටතේ තමාගේ බදු බැඳීම පිළිබඳව හැර, වෙනත් කාරණා පිළිබඳව තොරතුරු වාර්තා හෝ වාර්ෂික ප්‍රකාශ ගොනු කිරීමට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්-

"තොරතුරු වාර්තා සහ වාර්ෂික ප්‍රකාශ".

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) සමාලෝචනය සඳහා වූ ඉල්ලීම, ඉදිරිපත් කිරීමට නියම කරන ලද වාර්තාවක් හෝ වාර්ෂික ප්‍රකාශයක් නොමැතිව සාදනු ලැබූ තක්සේරුවකට එරෙහි විරෝධතාවක් වන අවස්ථාවක දී, ඒ ඉල්ලීම, අවස්ථාවෝචිත පරිදි, නිසි ලෙස සම්පූර්ණ කරන ලද වාර්තාවක් හෝ වාර්ෂික ප්‍රකාශයක් සමග යවනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(5) (අ) (4) වන උපවගන්ති යටතේ සමාලෝචනය සඳහා වූ ඉල්ලීමක් බදු ගෙවන්නකුගෙන් ලැබුණු පසු සහ එය ලැබුණු බව දැනුම් දුන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින් තක්සේරුව හෝ වෙනත් තීරණය සමාලෝචනය කළ යුතු ය.

(ආ) බදු ගෙවන්නා විසින් කරන ලද සමාලෝචනය සඳහා වූ ඉල්ලීම, තක්සේරුව කළ හෝ වෙනත් තීරණය ගන්නා ලද බදු නිලධරයා නොවන බදු නිලධරයකු විසින් සලකා බලනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "මේ පනත අනුව," යන වචන වෙනුවට "මේ පනත අනුව, එහෙත් 135 වන

වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල නිශ්චිතව දැක්වෙන කාල සීමාවන් නොතකා," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය සංශෝධනය කිරීම

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "139 වන වගන්තිය යටතේ පරිපාලන සමාලෝචන තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකුට එම තීරණයට විරුද්ධව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "139 වන වගන්තිය යටතේ, තක්සේරුවක් පිළිබඳ පරිපාලන සමාලෝචන තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකුට ඒ සමාලෝචන තීරණයට විරුද්ධව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "දින අනූවක් ඉක්ම ගොස්" යන වචන වෙනුවට "මාස හතක් ඉක්ම ගොස්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(5) මේ වගන්තිය යටතේ වූ අභියාචනා පෙත්සමක්, කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය ලැබී දින තිහක් ඇතුළත හෝ 139 වන වගන්තිය යටතේ කරන ලද පරිපාලන සමාලෝචනය සඳහා වූ ඉල්ලීම සිදුකර මාස හතක කාලසීමාව ඉක්ම යන දින සිට දින තිහක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයාට ද පිටපතක් සහිතව, බදු අභියාචනා කොමිෂන් සභාව වෙත ලිඛිතව ගොනු කරනු ලැබිය යුතු ය.";

(4) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(6) (5) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා (2) වන උපවගන්තිය යටතේ නියම කර ඇති ආකාරයට අභියාචනා පෙත්සමක් ගොනු කිරීමෙන් අභියාචක

වළක්වනු ලැබූ බවට සහ අභියාචකගේ පාර්ශ්වයෙන් අසාධාරණ ප්‍රමාදයක් සිදු වී නොමැති බවට බදු අභියාචනා කොමිෂන් සභාව සෑහීමට පත් කිරීමෙන් පසුව, අභියාචක විසින් තක්සේරුවකට එරෙහිව අභියාචනා කළ හැකි ය.”.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “(151 වන වගන්තිය යටතේ දීර්ඝ කරන ලද කාලය සැලකිල්ලට නොගනිමින් නිශ්චය කරන ලද,)” යන වචන සහ ඉලක්කම් වෙනුවට “(151 වන වගන්තිය යටතේ දීර්ඝ කරන ලද කාලය සැලකිල්ලට නොගනිමින් නිශ්චය කරන ලද)” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

“ඌන ගෙවීම් සහ ප්‍රමාද ගෙවීම් මත පොලිය”.

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(1) මේ පනත යටතේ ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් බදු ගෙවන්නෙකුට ආපසු ගෙවිය යුතු වන අවස්ථාවක දී, ආපසු ගෙවීම සඳහා වූ ඉල්ලීම ගොනු කරන ලද දින සිට, ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවනු ලබන දිනය තෙක්, ඒ ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය මත පොලියක් බදු ගෙවන්නාට ගෙවනු ලැබිය යුතු ය.”;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “ගොනුකර දින හැටක් ඇතුළත”යන වචන වෙනුවට “ගොනු කර මාස හයක් ඇතුළත” යන වචන ආදේශ කිරීමෙන්.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල "මාසිකව ගණනය කරනු ලබන," යන වචන වෙනුවට "මාසිකව ගණනය කරනු ලබන," යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ 190 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 190අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යః-

ප්‍රධාන ප්‍රඥප්තියට 190අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"විගණකවරුන්ට, බදු වෘත්තිකයන්ට, බදු උපදේශකවරුන්ට හෝ අනුමත ගණකාධිකාරීවරුන්ට අදාළ දණ්ඩන විධිවිධාන

190අ. බදු ගෙවන්නාගේ පූර්ණ කාලීන සේවානියුක්තයකු හැර-

(අ) කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා බදු වාර්තා, ගිණුම්, වාර්තා, අභියාචනා සහ විරෝධතා හෝ වෙනත් යම් ලේඛනයක් හෝ තොරතුරු පිළියෙල කරන, සම්පූර්ණ කරන හෝ සහතික කරන හෝ පිළියෙල කිරීමට, සම්පූර්ණ කිරීමට හෝ සහතික කිරීමට සහාය දෙන; සහ

(ආ) වෘත්තීයමය කාර්යයන් ඉටු කිරීමේ දී සිතාමතාම නොසලකා හරින හෝ ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්වීමට අපොහොසත් වන හෝ වංචනික ලෙස ඒ ලේඛන හෝ තොරතුරු සකස්කරන සහ සහතික කරන හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන මේ පනතේ හෝ වෙනත් යම් පනතක යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් සිතාමතාම වැරදි ලෙස අර්ථ නිරූපනය කරන,

යම් විගණකවරයකු, බදු වෘත්තිකයකු, බදු උපදේශකවරයකු හෝ අනුමත ගණකාධිකාරිවරයකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී, රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ මාස

හයක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් අදාළ තත්ත්වයෙන් ක්‍රියා කිරීම වැළැක්වීමේ තහනම් නියෝගයක් සඳහා යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ "(1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක්" යන වචන සහ ඉලක්කම වෙනුවට "පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ "කෘෂිකාර්මික ව්‍යාපාරය" යන යෙදුමේ අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපන ආදේශ කිරීමෙන්:-

""කෘෂිකාර්මික ව්‍යාපාරය" යන්නෙන්, කෘෂි ගොවිතැන සම්බන්ධ ව්‍යාපාරයක් හෝ කෘෂි පිරිසැකසුම් කිරීමේ ව්‍යාපාරයක් අදහස් වන අතර, එහෙත් ඊට අවස්ථාවෝචිත පරිදි, මත්පැන් හෝ දුම්කොළ නිපැයුම් හෝ නිෂ්පාදන ගොවිතැන් කිරීම හෝ පිරිසැකසුම් කිරීම ඇතුළත් නොවේ;

"කෘෂි ගොවිතැන" යන්නෙන්-

(අ) භූමිය සැකසීම සහ ඉඩමක ඕනෑම වර්ගයක පැළ වගා කිරීම, හරිතාගාරවල වගා කිරීම, මී මැසි පාලනය, මසුන් ඇති කිරීම, ඉස්සන් ඇති කිරීම හෝ සත්ත්ව පාලනය, කුකුළු ගොවිපළ, අභිජනනාගාර, පශු වෛද්‍ය සේවා හෝ කෘත්‍රිම සිංචන සේවා අදහස් වේ;

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමකට සම්බන්ධ වී ඇති යම් තැනැත්තකු විසින් ඒ ක්‍රියාකාරකම මගින් කරන ලද යම් නිෂ්පාදනයක් ඒ නිෂ්පාදනය වෙළෙඳපළ සඳහා සූදානම් කිරීමේ දී, පිරිසිදු කිරීම,

ප්‍රමාණ කිරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, කැපීම හෝ ශීත කිරීම අදහස් වන නමුත් ඊට කෘෂි පිරිසැකසුම් කිරීම හෝ ආහාර පිරිසැකසුම් කිරීම ඇතුළත් නොවේ;

"කෘෂි පිරිසැකසුම් කිරීම" යන්නෙන්, දේශීය වශයෙන් නිෂ්පාදිත යම් කෘෂිකාර්මික, මත්ස්‍ය හෝ සත්ත්ව නිෂ්පාදන පිරිසැකසුම් කිරීම අදහස් වන අතර, වෙළඳපළ සඳහා සූදානම් කිරීමේ දී ඒ නිෂ්පාදනවල හැඩය, ආකෘතිය හෝ භෞතික පෙනුම වෙනස් කිරීමේ කාර්යය සඳහා විජලනය කිරීම, ඇඹරීම, ඇසුරුම් කිරීම, ටින්වල ඇසිරීම සඳහා වූ ව්‍යවසායක් ද ඊට ඇතුළත් වන නමුත් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යවසායක් ඊට ඇතුළත් නොවේ;";

(3) ඒ වගන්තියේ "ලාභාංශ" යන යෙදුමේ අර්ථ නිරූපනයේ (අ) ඡේදයේ, "විකුණූ කොටස් ආපසු ගැනීමක දී" යන වචන වෙනුවට "කොටස් ආපසු මිල දී ගැනීමක දී" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ "සංග්‍රහ" යන යෙදුමේ අර්ථ නිරූපනයේ " යම් තැනැත්තකුට ආහාර, පාන, දුම්කොළ," යන වචන වෙනුවට "යම් තැනැත්තකුට මත්පැන්, දුම්කොළ," යන වචන ආදේශ කිරීමෙන්;

(5) ඒ වගන්තියේ "කළමනාකරු" යන යෙදුමේ අර්ථ නිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්:-

""නිෂ්පාදනය කිරීම" යන්නෙන්-

(අ) යම් අජීවී භෞතික ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ දෙයක් වෙනස් නාමයක්, ස්වරූපයක් හෝ භාවිතයක් ඇති අලුත් සහ වෙනස් වූ ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ දෙයක් බවට පරිවර්තනය කිරීමකට හේතුවන්නා වූ; හෝ

(ආ) වෙනස් රසායනික සංයුතියක් හෝ පූර්ණ ව්‍යුහයක් ඇති අලුත් සහ වෙනස් වූ ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ දෙයක් බිහි කරන්නා වූ,

යම් අජීවී භෞතික ද්‍රව්‍යයකට, භාණ්ඩයකට හෝ දෙයකට සිදු කරනු ලබන වෙනසක් අදහස් වේ;";

(6) ඒ වගන්තියේ "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපනයේ (ආ) ඡේදයේ "අස්ථිත්වයක් වන" යන වචන වෙනුවට "ඒ තැනැත්තාගේ සහ ආශ්‍රිතයාගේ වාර්ෂික දළ පිරිවැටුමේ එකතුව රුපියල් 500,000,000 කට අඩුනම් මිස, අස්ථිත්වයක් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(7) ඒ වගන්තියේ "නිශ්චිත ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපනයේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ඕ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් ව ඇති අපනයන අභිමුඛ සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ-

(i) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු විරාම භුක්ති විඳින සමාගමක් ද ඇතුළුව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇත්තා වූ ද, ඒ ගිවිසුමේ විධිවිධාන යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළ තීරුබදු රහිත පදනම මත ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවසරය දෙනු ලැබ ඇත්තා වූ ද සමාගමකට; හෝ

(ii) යම් ආණ්ඩුවේ අධිකාරියක් යටතේ තීරු බදු රහිත පදනම මත විශේෂිත භාණ්ඩ ආනයනය කිරීමට සුදුසුකම් ලබන තැනැත්තකුට,

ආනයන ආදේශනය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රමාණය තෙක්, 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ තුනක කාලය ඇතුළත විකුණන;

(ක) නිශ්චිතව දක්වන ලද වරාය පරිශ්‍රයක් තුළ, දේශීය තෙල් සැපයුම්කරුවන් වෙත සමුද්‍රීය ඉන්ධන සැපයීම ද ඇතුළත් ව, සමුද්‍රීය ඉන්ධන සැපයීම හා සම්බන්ධ ඉන්ධන සැපයුම් සේවා සලසන;";

(8) ඒ වගන්තියේ "ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනය" යන යෙදුමේ අර්ථ නිරූපනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන්:-

"ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනය" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ ඒ ව්‍යාපාරය කරගෙන යන්නා වූ දින ගණන නොසලකා, ව්‍යාපාර ආයතනයේ ව්‍යාපාරික කටයුතු සම්පූර්ණයෙන් හෝ අර්ධ ලෙස කරගෙන යන යම් ව්‍යාපාරික සම්බන්ධතාවයක් හෝ ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් අදහස් වේ;";

(9) ඒ වගන්තියේ "බදු වාර්තාව" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "වාර්තාවක් අදහස් වේ;" යන වචන වෙනුවට "වාර්තාවක් හෝ වාර්ෂික ප්‍රකාශයක් අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(10) ඒ වගන්තියේ "බදුගෙවන්නා" යන යෙදුමේ අර්ථ නිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්:-

"තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව" යන්නෙන්, 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අදහස් වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තිය සංශෝධනය කිරීම

**49.** ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "වසර පහකට පසුව" යන වචන වෙනුවට "වසර හතකට පසුව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය සංශෝධනය කිරීම

**50.** ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "2017 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**51.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "2018 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එහෙත් 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කාලපරිච්ඡේදය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (1) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2020 ජනවාරි මස 1 වන දින සිට, වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අයකළ හැකි ආදායම මත පහත අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු යː-

| තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|

| | |
|---|---|
| රු. මිලියන 3 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. මිලියන 3 ඉක්මවන නමුත් රු. මිලියන 6 නො ඉක්මවන | රු. 180,000 ක් වූ මුදලක් සහ රු. මිලියන 3 ට අතිරික්ත මුදලින් 12% |
| රු. මිලියන 6 ඉක්මවන | රු. 540,000 ක් වූ මුදලක් සහ රු. මිලියන 6 ට අතිරික්ත මුදලින් 18%"; |

(ඇ) ඒ ඡේදයේ (2) වන උපඡේදයේ -

(i) ඒ උපඡේදයේ (ආ)(i) අයිතමයේ "දායක කාලසීමාව" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව දායක කාලසීමාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ)(ii) අයිතමයේ "දායක කාලසීමාව" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව දායක කාලසීමාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ (ආ)(ii) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(iii) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව:

| තක්සේරු වර්ෂයක් සඳහා (3) වන උපඡේදයේ සඳහන් සේවානියුක්තියෙන් ලබන මුළු ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 10,000,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 0% |

| | |
|---|---|
| රු. 10,000,000 ඉක්මවන නමුත් රු. 20,000,000 නො ඉක්මවන | රු. 10,000,000 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 20,000,000 ඉක්මවන | රු. 600,000 ක් වූ මුදලක් සහ රු. 20,000,000 ට අතිරික්ත මුදලින් 12%"; |

(ඇ) ඒ ඡේදයේ (3) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ "(2) වන උපඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම වෙනුවට "(2) වන උපඡේදයේ (ආ) අයිතමයේ සඳහන්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ඇ) අයිතමයේ "ලැබූ මුදල් ප්‍රමාණ;" යන වචන වෙනුවට "ලැබූ මුදල් ප්‍රමාණ; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ (ඈ) සහ (ඉ) අයිතම ඉවත් කිරීමෙන්; සහ

(iv) ඒ උපඡේදයේ (ඊ) අයිතමය එහි (ඇ) අයිතමය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්;

(ඉ) ඒ ඡේදයේ (4) වන උපඡේදයේ "මත්පැන් හෝ දුම්කොළ" යන වචන වෙනුවට "යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය කිරීම සහ විකිණීම" යන වචන ආදේශ කිරීමෙන්;

(ඊ) ඒ ඡේදයේ (4) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(5) (1අ) වන උපඡේදයේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මැණික් හෝ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාවෙන් වූ යම් පුද්ගලයකුගේ ලැබීම් සහ ලාභ මත 14%ක උපරිම අනුප්‍රමාණය අනුව බදු අය කරනු ලැබිය යුතු ය.";

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

**"2. හවුල් ව්‍යාපාර සඳහා බදු අනුප්‍රමාණය.**

(1) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත් ව, 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි හවුල් ව්‍යාපාරයක බදු අය කළ හැකි ආදායම මත පහත සඳහන් අනුප්‍රමාණවලට අනුව බදු පැනවිය යුතු යː-

| තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 1,000,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 0% |
| රු. 1,000,000 ඉක්මවන | රු. 1,000,000 ට අතිරික්ත මුදලින් 6% |

(2) හවුල් ව්‍යාපාරයක බදු අය කළ හැකි ආදායමට ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම තුළින් ලැබෙන ලැබීම් ඇතුළත් වන අවස්ථාවක දී-

(අ) එම ලැබීම් මත, 10% ක අනුප්‍රමාණයකින් හවුල් ව්‍යාපාරයට බදු පැනවිය යුතු ය; සහ

(ආ) හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායමේ අවශේෂය මත පමණක් (1) වන උපඡේදයේ සඳහන් අනුප්‍රමාණයට අනුව බදු පැනවිය යුතු ය.";

(3) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ (1) වන උපඡේදයේ, "ආදායම 24%ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "ආදායම 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින් ද, 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 18% ක අනුප්‍රමාණයකින් ද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන, (2අ) වන සහ (3) වන උපඡේදවලට යටත්ව, තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.";

(ආ) ඒ ඡේදයේ (2) වන උපඡේදයේ, "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (2) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක ඒ ලැබීම් සහ ලාභ කොටස මත පහත සඳහන් අනුප්‍රමාණවලට අනුව බදු පැනවිය යුතු යඃ-

(අ) ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් හෝ මත්පැන් විකිණීමෙන් ලැබුණු ලැබීම් සහ ලාභ හැර (මත්පැන් සම්බන්ධයෙන් වන විට, හුදෙක් වෙනත් ව්‍යාපාරයකට ආනුෂංගික වන ව්‍යාපාරයකින් ලැබුණු ඒ ලැබීම් සහ ලාභ හැර) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ව්‍යාපාරයෙන් ලද ලැබීම් සහ ලාභ - 14%;

(ආ) භාණ්ඩ අපනයනය කිරීම ද ඇතුළුව, භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී ඒ විකිණීම හෝ අපනයනය කිරීම සඳහා වන ගෙවීම විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන අවස්ථාවක සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී, ඒ ව්‍යාපාරයේ ලැබීම් සහ ලාභ - 14%;

(ඇ) නිශ්චිත ව්‍යවසායයක ලැබීම් සහ ලාභ - 14%;

(ඈ) අධ්‍යාපන සේවා සැපයීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 14%;

(ඉ) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ව්‍යවසායයක ලැබීම් සහ ලාභ - 14%;

(ඊ) ඉදිකිරීමේ සේවා සැපයීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 14%;

(උ) කෘෂි පිරිසැකසුම්වලින් ලබන ලැබීම් සහ ලාභ - 14%;

(ඌ) සෞඛ්‍ය රැකවරණ සේවා සැපයීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 14%;

(එ) වාසික සමාගමකින් ලද ලාභාංශවලින් වූ ලැබීම් සහ ලාභ - 14%;

(ඒ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි යම් අපනයන සමාගමක් විසින්, සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන, සෞඛ්‍ය අමාත්‍යංශයට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට, ශ්‍රී ලංකා නාවික හමුදාවට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට, ශ්‍රී ලංකා පොලීසියට සහ කෝවිඩ් (COVID) මධ්‍යස්ථානයට සැපයීම වෙනුවෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාවෙන් උපයන ලද ලැබීම් සහ ලාභ - 14%;

(ඔ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ, 2021 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2021 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව ස්වකීය කොටස් ලැයිස්තුගත කරන යම් සමාගමක ලැබීම් සහ ලාභ (මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි ඉහළ ආදායම් බදු අනුප්‍රමාණයක් අදාළ වුව ද) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ තුනක් සඳහා - 14%;

(ඕ) මැණික් හෝ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාවෙන් වූ ලැබීම් සහ ලාභ - 14%;

(ක) මේ උපඡේදයේ (අ), (ආ), (ඇ), (ඒ) හෝ (ඔ) අයිතමයට යටත්ව, නිෂ්පාදනය කිරීම්වලින් ලබන ලැබීම් සහ ලාභ - 18%;

(ග) ඔට්ටු ඇල්ලීම් සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%;

(ච) යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කොට විකිණීමෙන් හෝ ආනයනය කොට විකිණීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%;";

(ඈ) ඒ ඡේදයේ (4) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(5) මේ උපලේඛනයේ 4 වන ඡේදයේ (1) වන, (2අ) වන, (3) වන සහ (4) වන උපඡේදවලට අනුකූලව ගණනය කරන ලද, සමාගමක් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද පහත දැක්වෙන පරිදි අඩු කරනු ලැබිය යුතු යː-

(අ) 2021 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 2021 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ ස්වකීය කොටස් ලැයිස්තුගත කරන යම් සමාගමක් විසින් (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ වූ යම් ගිවිසුමක විධිවිධාන සලසා ඇති පදනම අනුව සහ බදු අනුප්‍රමාණය අනුව ගණනය කරනු ලබන සහ ගෙවිය යුතු වන ආදායම් බද්ද ඇතුළුව, එහෙත් ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම් මත ගෙවිය යුතු බද්ද හැර) ගෙවිය යුතු සමස්ත ආදායම් බද්ද 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය;

(ආ) යම් බහුජාතික සමාගමක් විසින් ලාභාංශ වලින් ලබන ලැබීම් සහ ලාභ මත ගෙවිය යුතු ආදායම් බද්ද-

(i) (මෙහි මින්මතු "පළමු වර්ෂය" ලෙස හඳුන්වනු ලබන) පෙරාතුව ම වූ තක්සේරු වර්ෂයට

සාපේක්ෂව 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයේ දී (නිශ්චිත ව්‍යවසායයන් හැර) අපනයනවල සියයට තිහක වැඩිවීමක් තිබිය යුතු වීම; හෝ

(ii) පළමු වර්ෂයට සාපේක්ෂව 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයේ දී (නිශ්චිත ව්‍යවසායයන් හැර) අපනයනවල සියයට පනහක වැඩිවීමක් තිබිය යුතු වීම සහ පසුව එළඹෙන තක්සේරු වර්ෂයේ දී ඒ තත්ත්වය පවත්වා ගත යුතු වීම,

යන කොන්දේසියට යටත්ව, 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා සියයට විසිපහකින් සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ දෙක සඳහා සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.";

(5) ඒ උපලේඛනයේ 5 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ "28%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතුය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (2) වන උපඡේදයේ "ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීමෙන්" යන වචන වෙනුවට "ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන්"යන වචන ආදේශ කිරීමෙන්;

(6) ඒ උපලේඛනයේ 7 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ "28% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට

"2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (3) වන උපඡේදයේ "28% ක් විය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක් විය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(7) ඒ උපලේඛනයේ 8 වන ඡේදයේ ශීර්ෂයේ "අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප්" යන වචන වෙනුවට "අර්ථසාධක, විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික අරමුදල්" යන වචන ආදේශ කිරීමෙන්;

(8) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ-

(අ) ඒ උපඡේදයේ (ඇ)(ii) වන අයිතමයේ "14%; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "14%;" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපඡේදයේ (ඇ)(iii) වන අයිතමයේ "14%," යන ඉලක්කම් වෙනුවට "14%; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපඡේදයේ (ඇ)(iii) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(iv) 85(1අ) වගන්තියේ සඳහන් ගෙවීම් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී-

(ivඅ) ගෙවන ලද පොලිය හෝ වට්ටම සඳහා-5%;

(ivආ) වෙනත් සියලු ගෙවීම් සඳහා - 14%,";

(9) ඒ උපලේඛනයේ 10 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

**"11. කෘෂි ගොවිතැන සමග කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ නිරත තැනැත්තන් සඳහා බදු අනුප්‍රමාණය.**

යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ ඔහුගේ කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර කටයුත්ත සඳහා ඔහු විසින් නිෂ්පාදනය කරන ලද කෘෂි ගොවි නිෂ්පාදන භාවිත කරන අවස්ථාවක, තමා විසින් නිෂ්පාදනය කරන ලද ඒ කෘෂි ගොවි නිෂ්පාදන, කෘෂි පිරිසැකසුම් කිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන ලද මුළු කෘෂි ගොවි නිෂ්පාදනවලට දරන අනුපාතයට අනුරූපී වන්නා වූ, ඒ කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර කටයුත්ත සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු කොටස, 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ පහක කාලසීමාව සඳහා සියයට විසිපහකින් අඩු කරනු ලැබිය යුතු ය.

**12. විවිධ ලැබීම් සහ ලාභ සම්බන්ධයෙන් බදු අනුප්‍රමාණ අදාළ කර ගැනීම.**

යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායම, විවිධ ආදායම් මූලාශ්‍රවලින් හෝ විවිධ ව්‍යාපාර කටයුතුවලින් වූ ලැබීම්වලින් සහ ලාභවලින් සමන්විත වන අවස්ථාවක දී, ඒ එක් එක් ආදායම් මූලාශ්‍රයට හෝ ඒ විවිධ ව්‍යාපාර කටයුතුවලින් වූ ලැබීම්වලට සහ ලාභවලට අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණ, ඒ ආදායම් මූලාශ්‍රයට හෝ ඒ ලැබීම්වලට සහ ලාභවලට අදාළ කර ගනු ලැබිය යුතු ය.".

**52.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (2) වන උපඡේදය, (3) වන උපඡේදය සහ (4) වන උපඡේදය යන උපඡේදවල "යම් තැනැත්තකු විසින් දරනු ලබන මුළු වියදම" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින් කරනු ලබන මුළු ආයෝජනය" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (6) වන උපඡේදයේ, "කල් දැමිය යුතු ය." යන වචන වෙනුවට "කල් නොදැමිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (9) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

**"බදු ඉඩම් මත වැඩි දියුණු කිරීම්**

(9) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ උපලේඛනයේ කාර්යය සඳහා, ආයෝජනයක් කරන ලද තැනැත්තකු විසින් බදු ඉඩමක් තුළ ඉදිකරන ලද හෝ සාදන ලද යම් ගොඩනැගිල්ලක්, සැකිල්ලක් හෝ ස්ථිර ස්වභාවයේ සමාන කටයුත්තක්, අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකනු නොලැබිය යුතු නමුත් ක්ෂය විය හැකි වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය.";

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

**"රඳවා ගැනීමේ බද්දෙන් ඇතැම් ලාභාංශ නිදහස් කිරීම**

2. පළමුවන උපලේඛනයේ කුමක් සඳහන් වුව ද,2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව නිර්වාසික සාමාජිකයකු වෙත ලාභාංශයක් ගෙවනු ලබන සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ (අස්පෘශ්‍ය වත්කම් හැර) ක්ෂය විය හැකි වත්කම් මත ඇ.ඩො. මිලියන 250 කට වඩා වැඩි මුදලක් දරා ඇත්නම්, ඒ ලාභාංශ ගෙවීම මේ උපලේඛනය යටතේ වූ වැඩි කළ ප්‍රාග්ධන දීමනා මඟින් ආරක්ෂාව සලසන ලද ලාභ මඟින් සිදු කරනු ලබන්නා වූ කාලසීමාව සඳහා ඒ සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශය මත අදාළ කර ගනු ලැබිය යුතු බදු අනුපාතය ශුන්‍යය විය යුතු ය.";

(3) ඒ උපලේඛනයේ 3 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

**"සේවානියුක්ති ආදායම නිදහස් කිරීම**

3. පළමුවන උපලේඛනයේ කුමක් සඳහන් වුව ද, රටින් බැහැරව වසන සේවා නියුක්තයකුට ගෙවීමක් සිදු කරනු ලබන සමාගමක් ශ්‍රී ලංකාව තුළ (අස්පෘශ්‍ය වත්කම් හැර) ක්ෂය විය හැකි වත්කම් මත ඇ.ඩො. මිලියන 250 කට වඩා වැඩි මුදලක් දරා ඇත්නම්, ඒ ගෙවීම මේ උපලේඛනය යටතේ වූ වැඩි කළ ප්‍රාග්ධන දීමනා මඟින් ආරක්ෂාව සලසන ලද ලාභ මඟින් සිදු කරනු ලබන්නා වූ කාලසීමාව සඳහා හෝ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමේ සිට

අවුරුදු පහක කාලසීමාවක් සඳහා යන දෙකෙන් වැඩි කාලසීමාව සඳහා, එම කාලසීමාව තුළ යම් අවස්ථාවක රටින් බැහැරව වසන සේවානියුක්තයන් සංඛ්‍යාව විස්ස නොඉක්මවන්නේ නම්, ඒ රටින් බැහැරව වසන සේවානියුක්තයකුගේ සේවානියුක්ති ආදායම මත අදාළ කර ගනු ලැබිය යුතු බදු අනුපාතය ශූන්‍යය විය යුතු ය.".

**53.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ (ඈ) ඡේදයේ (ii) වන උපඡේදයේ "අර්ථසාධක අරමුදලකින්," යන වචන වෙනුවට "අර්ථසාධක අරමුදලකින් හෝ නියාමනය කරන ලද අර්ථසාධක අරමුදලකින්," යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඌඌ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ඉඩකඩම් දේපළ පිළිබඳ ආයෝජන භාරයකට විකුණන ලද, හුවමාරු කරන ලද හෝ මාරු කරන ලද ඉඩම් හෝ ගොඩනැගිලි උපලබ්ධි කිරීමෙන් 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් තැනැත්තකුට ලැබුණු ලැබීමක්;"

(3) ඒ උපලේඛනයේ (එ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(එ) (i) පුණ්‍ය ආයතනයකට උපචිත වන හෝ එය විසින් උපයනු ලබන පොලිය එම පුණ්‍ය ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන නිවාසයක සිටින ළමයින්ට, වැඩිහිටියන්ට හෝ ආබාධිතයන්ට රැකවරණය සැලසීමේ කාර්යය සඳහා සම්පූර්ණයෙන් යොදවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරින් සනාථ කරන අවස්ථාවක දී, ඒ පුණ්‍ය ආයතනයට උපචිත වන හෝ ඒ පුණ්‍ය ආයතනය විසින් උපයනු ලබන පොලිය;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු වෙත හෝ ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කරන ලද යම් ණය මුදලක් මත ඒ තැනැත්තාට උපචිත වන හෝ ඒ තැනැත්තා විසින් උපයනු ලබන පොලිය;

(iii) යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකු වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව යම් වාණිජ බැංකුවක හෝ යම් විශේෂිත බැංකුවක විවෘත කරන ලද යම් විදේශීය ව්‍යවහාර මුදල් ගිණුමක විදේශ ව්‍යවහාර මුදල්වලින් ඒ තැනැත්තාගේ බැරට පවතින මුදල් මත 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ඒ තැනැත්තාට උපචිත වන හෝ ඒ තැනැත්තා විසින් උපයනු ලබන පොලිය;

(iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග මගින් නියම කර ඇති පරිදි, බලයලත් වෙළෙන්දකු සමඟ, යම් නම් කරන ලද විදේශීය ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කර පවත්වා ගෙන යනු ලබන (පසුව අලුත් කරන ලද ගිණුම් හැර), "විශේෂ තැන්පතු ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන කාලීන තැන්පතු ගිණුමකින් 2020 අප්‍රේල් මස 8 වන දින හෝ ඉන්පසුව යම් තැනැත්කුට උපචිත වන හෝ ඒ තැනැත්තා විසින් උපයනු ලබන පොලිය;

(v) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් සුබසාධක සමිතියකට උපචිතවන හෝ ඒ සමිතිය විසින් උපයනු ලබන පොලිය;

මේ ඡේදයේ "සුබසාධක සමිතිය" යන්නෙන්, ස්වකීය සාමාජිකයන්ගේ ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කරන යහසාධක අරමුදලක් ද ඇතුළත්ව, ස්වකීය සාමාජිකයන්ගේ හෝ ඔවුන්ගේ පවුල්වල සුබසාධනය සඳහා පිහිටුවා ඇති හෝ සකස්කර ඇති සහ සාමාජිකයන් විසින් දායක මුදල් සපයනු ලබන, එහෙත් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව හෝ බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද යම් සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් නොවන, අරමුදලක් හෝ සමිතියක් අදහස් වේ;

(vi) යම් බහුජාතික සමාගමක් විසින්, යම් දේශීය බැංකුවක, විදේශීය ව්‍යවහාර මුදලින් යම් තැන්පතුවක් විවෘත කර පවත්වාගෙන යාමේ දී, ඒ තැන්පතුව යම් තක්සේරු වර්ෂයක එහි ආනයන වියදම් ආවරණය කිරීමට පවත්වාගෙන යන්නේ නම්, 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඒ තැන්පතුවෙන් ඒ බහුජාතික සමාගමට උපචිත වූ හෝ ඒ සමාගම විසින් උපයනු ලබන පොලිය;

මේ ඡේදයේ "බහුජාතික සමාගම" යන්නෙන්, රටවල් දෙකක් හෝ ඊට වැඩි ගණනක් තුළ ව්‍යාපාර ආයතන සහිතව, ආශ්‍රිත සමාගම් සමූහයක කොටසක් වන්නා වූ සමාගමක් අදහස් වේ;";

(4) ඒ උපලේඛනයේ (ඔ) ඡේදය සහ (ඕ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඔ) (i) 1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජනාධිපති අරමුදලින් හෝ 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදලින් යම් තැනැත්තකුට ලැබෙන;

(ii) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් වෙන් කරන ලද අරමුදල්වලින් හෝ රජය හරහා සපයන ලද යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවකට ලැබෙන,

යම් මුදලක්;

(ඕ) (i) දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද, යම් ස්වෛරී බැඳුම්කරයක් මත වන පොලිය, වට්ටම හෝ යම් ලැබීමක් උපලබ්ධි කිරීම වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් නොවන යම් නිර්වාසික තැනැත්තකු විසින් උපයන;

(ii) විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ද ඇතුළුව යම් ස්වෛරී බැඳුම්කරයක් මත, අවස්ථාවෝචිත පරිදි, ගෙවන ලද හෝ ඉඩ දෙන ලද පොලිය හෝ වට්ටම වශයෙන් යම් තැනැත්තකු විසින් උපයන,

යම් ආදායමක්;";

(5) ඒ උපලේඛනයේ (ඕ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඕඕ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඇ.ඩො. මිලියන 100 කට නොඅඩු සමස්ත ආයෝජනයක් කරන ලද වාණිජ බැංකුවක් හෝ බලයලත් වෙළෙන්දෙකුට ඒ බැඳුම්කර උපලබ්ධි කිරීමෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීමක්;

(ඕඕඕ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ සුරැකුම්පත්වලින් හෝ භාණ්ඩාගාර බැඳුම්කරවලින් හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ භාණ්ඩාගාර බිල්පත්වලින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති යම් සමෘද්ධි ප්‍රජා පාදක බැංකුවලට 2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව උපචිත වූ හෝ උපයන ලද පොලිය හෝ වට්ටම;";

(6) ඒ උපලේඛනයේ (ච) ඡේදයේ "ගෙවනු ලබන ලාභාංශයක්;" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව, ගෙවනු ලබන ලාභාංශයක්;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(7) ඒ උපලේඛනයේ (ච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(චච) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව-

(i) වාසික සමාගමක් විසින්, ඒ වාසික සමාගමට ලැබුණු ලාභාංශ මගින් වූ ලැබීම්වලට සහ ලාභවලට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට හෝ ඒ ලාභාංශ මගින් වූ ලැබීම්වලින් සහ ලාභවලින් ව්‍යුත්පන්න වන ප්‍රමාණයට, සාමාජිකයකුට ගෙවනු ලබන ලාභාංශයක්;

(මේ ඡේදයේ "ලාභාංශ මගින් වූ ලැබීම්වලට සහ ලාභවලට" යන්නෙන්, මේ පනතේ විධිවිධානවලට යටත්ව වියදම් හෝ යම් පාඩු සහ ඒ සමාගමට

ලැබුණු ඒ ලාභාංශ මත ගෙවන ලද හෝ ගෙවිය යුතු ආදායම් බද්ද අඩු කිරීමෙන් පසුව, ඒ සමාගමට ලැබුණු ලාභාංශ අදහස් වේ);

(ii) වාසික සමාගමක් විසින්, නිර්වාසික තැනැත්තකු වන සාමාජිකයකු වෙත ගෙවනු ලබන ලාභාංශයක්;

(iii) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධානවලට අනුව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල නිරත වන සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් වාසික සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශයක්:-

(iiiඅ) ආනයනය කිරීම, සුළු වශයෙන් පිරිසැකසුම් කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධිත යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාම;

(iiiආ) එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක් වෙරළ ව්‍යාපාර;

(iiiඇ) විදේශයන්හි සේවාදායකයන් සඳහා අභිමුඛ සේවා සැපයීම;

(iiiඈ) මූල්‍ය සැපයුම් ජාලය සහ බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලයීය මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(iiiඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශ්වීය ඒකාබද්ධ කිරීම් ඇතුළු කාර්ය සම්පාදන සේවා සිදු කිරීම;";

(8) ඒ උපලේඛනයේ (ඩ) ඡේදයේ "යම් වාසික සමාගමකට" යන වචන වෙනුවට "යම් තැනැත්තකුට" යන වචන ආදේශ කිරීමෙන්;

(9) ඒ උපලේඛනයේ (ඨ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඨඨ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නිවාස ඉඩකඩම් ආයෝජන භාරයක ඒකක හිමියකු විසින්, ඒකක උපලබ්ධි කිරීම මත වූ ලාභාංශ සහ ලැබීම් හෝ ව්‍යාපාරයක හෝ ආයෝජනයක ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබීම් ලෙස උපයන ලද මුදල් ප්‍රමාණ;";

(10) ඒ උපලේඛනයේ (ණ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ත) ගුවන් යානා, මෘදුකාංග බලපත්‍ර හෝ වෙනත් අදාළ සේවාවන් සඳහා වන යම් ගෙවීමක් ලෙස, සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් යම් නිර්වාසික තැනැත්තකු විසින් 2018 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව උපයන ලද යම් මුදලක්;

(ථ) යම් තැනැත්තකු විසින්-

(i) 2019 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂ පහක කාල සීමාව තුළ ඒ තැනැත්තාගේ කෘෂි ගොවිතැනෙන් වූ නිෂ්පාදන විකිණීමෙන්, ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ලැබීම් සහ ලාභ:

එසේ වුව ද, කෘෂි ගොවි නිෂ්පාදන නිපදවන හා ඒ නිෂ්පාදන, කෘෂි පිරිසැකසුම් කිරීම සඳහා හෝ යම් නිෂ්පාදිත නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගැනීමෙන් සමන්විත වන යම් ව්‍යවසායකට අදාළව, එම නිෂ්පාදන කෘෂි පිරිසැකසුම්කරුවකුට හෝ නිෂ්පාදකයකුට ඒ විකිණීම සිදු වූයේ යයි සලකනු ලබන අවස්ථාවේ දී පැවති වෙළඳපළ මිලට විකුණනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර, කෘෂි ගොවිතැනට අදාළව, ඒ සිදුවූයේ යයි සලකනු ලබන විකිණීම මත පදනම්ව ගණනය

කරන ලද ලැබීම් සහ ලාභ, 2019 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂ පහක කාලසීමාව තුළ නිදහස් කරන ලද ලැබීම් සහ ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ii) 2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව, නියම කරනු ලැබිය හැකි තොරතුරු තාක්ෂණ සහ සඵල සේවා සැපයීමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ලැබීම් සහ ලාභ;

(iii) 2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා වන ගෙවීම, විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී ඒ සේවා සැපයීමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ලැබීම් සහ ලාභ;

(iv) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ((iii) වන උපඡේදයේ සඳහන් ලැබීම් සහ ලාභ නොවන) යම් විදේශීය මූලාශ්‍රයකින් ලබන ලැබීම් සහ ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද අවස්ථාවක දී හෝ උද්ගත වන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී ඒ විදේශීය මූලාශ්‍රයෙන්, ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ඒ ලැබීම් සහ ලාභ;

(v) තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සංකල්පය (TVETසංකල්පය) යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන යම් වෘත්තීය අධ්‍යාපන

ආයතනයක, යම් වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්වලින්-

(අ) ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂය තුළ ඒ ආයතනය විසින් වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්වලට බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා සසඳනු ලබන විට, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ආයතනය විසින් ඒ වැඩසටහන් සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයක් කර තිබේ නම්;

(ආ) 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වසර පහක කාලසීමාවක් සඳහා,

ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ලැබීම් සහ ලාභ:

එසේ වුව ද, (අ) ඡේදයේ කාර්යය සඳහා, පළමු වර්ෂය සඳහා විධිවිධාන සලසා ඇති පරිදි වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්වලට සිසුන් බඳවා ගැනීම දෙගුණ කර ඇති සහ පළමු වර්ෂයේ දී ඒ වැඩසටහන්වලට බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉදිරි වර්ෂ හතර සඳහා ද පවත්වාගෙන ගොස් ඇති යම් ආයතනයක්, ඒ වර්ෂ තුළ එකී අවශ්‍යතාවය සපුරන ලද ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(vi) 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, රත්‍රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමේ ව්‍යාපාරයකින් හෝ මැණික් ශ්‍රී ලංකාවට ගෙනැවිත් ඒ මැණික් කපා ඔපදමා අපනයනය කිරීමේ ව්‍යාපාරයකින් විදේශීය ව්‍යවහාර මුදලකින් උපයන ලද ලැබීම් සහ ලාභ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම්, ඒ තැනැත්තාට ලැබුණු හෝ ඒ තැනැත්තා විසින් උපයන ලද ඒ ලැබීම් සහ ලාභ;

(න) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව -

(i) රසායනාගාර සේවාවලින් හෝ ප්‍රමිති සහතික කිරීමේ සේවාවලින් යම් නිර්වාසික තැනැත්තකුට ව්‍යුත්පන්න වූ යම් මුදල් ප්‍රමාණයක්;

(ii) ආගමික කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති යම් ආගමික ආයතනයකට ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් ව්‍යුත්පන්න වූ යම් මුදල් ප්‍රමාණයක්;

(ප) (පවතින ව්‍යවසායක් බෙදා වෙන්කිරීමෙන් හෝ ප්‍රතිනිර්මාණය කිරීමෙන් පිහිටවනු නොලැබූ) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරන ලද පහත දැක්වෙන යම් අලුත් ව්‍යවසායකින්, මෙහි ඇතුළත් කොන්දේසිවලට යටත්ව සහ මෙහි සඳහන් කාලය සඳහා යම් තැනැත්තකුට (මේ පනතේ IV වන පරිච්ඡේදය යටතේ ගණනය කරන ලද පරිදි ඒ ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම් සහ වගකීම් උපලබ්ධි කිරීමෙන් ලැබුණු යම් ලැබීමක් හැර) ඒ ව්‍යාපාරයෙන් ලැබුණු හෝ ව්‍යුත්පන්න වූ ලැබීම් සහ ලාභඃ-

(i) දැනටමත් ඉදිකිරීමේ කර්මාන්තයෙහි භාවිත කරනු ලැබ ඇති ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද, තෝරාගත් වෙනමම වූ වැඩබිමක ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය විකිණීමෙහි නිරත ව්‍යවසායකට, වසර දහයක කාල සීමාවක් සඳහා; (තමා විසින්ම ඒ කොන්දේසිවලට අනුව වැඩබිමක ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉදිකිරීමේ ද්‍රව්‍ය භාවිත කරමින් යම් තැනැත්තකු ඉදිකිරීම් සේවා සැපයීමෙහි නිරතවන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ ඉදිකිරීම් ද්‍රව්‍ය පවතින වෙළඳපොළ මිලට ඉදිකිරීම් සේවාවන් සඳහා විකුණනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.);

(ii) තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සංකල්පය (TVET සංකල්පය) යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින්, වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව යම් පුද්ගලයකු විසින් 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ කරන ලද යම් ව්‍යාපාරයකට, වසර පහක කාලසීමාවක් සඳහා;

(iii) ශ්‍රී ලංකාව තුළ බෝට්ටු හෝ නැව් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා නේවාසික තැනැත්තකු විසින් ආරම්භ කරන ලද ව්‍යවසායකට, ඒ බෝට්ටු හෝ නැව් සැපයීමෙන් ලැබුණු හෝ ව්‍යුත්පන්න වූ යම් ලැබීම් සහ ලාභ, වසර හතක කාලසීමාවක් සඳහා;

(iv) මෙගා වොට් සියයකට නොඅඩු සූර්ය හෝ සුළං බලශක්තියක් නිපදවීමේ හැකියාව සහිතව පිහිටුවන ලද සහ ඒ බලශක්තිය ජාතික විදුලි බල පද්ධතියට සපයන යම් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියකට, වසර හතක කාලසීමාවක් සඳහා;

(v) ශ්‍රී ලංකාවේ දේශීය ශ්‍රමය හා දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින් සන්නිවේදන කුළුණු සහ ඒ ආශ්‍රිත උපකරණ ඉදිකරන සහ ස්ථාපනය කරන හෝ ඒ ඉදිකිරීම් හෝ ස්ථාපනය සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සපයන 2021 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වාසික පුද්ගලයකු විසින් ආරම්භ කරන ලද ව්‍යවසායකට, වසර පහක කාලසීමාවක් සඳහා;

(vi) කොළඹ සහ හම්බන්තොට වරායවල, බන්ධිත ගුදම් හෝ අක්වෙරළ ව්‍යාපාරයට සම්බන්ධ ගුදම් බදු දීම සඳහා වන ව්‍යවසායකට, යම් තැනැත්තකු ඒ ව්‍යවසාය සඳහා වූ ආයෝජනය 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව කර ඇත්නම්;

ඉහත ((vi) වන උපඡේදය හැර) උපඡේදවල දක්වා ඇති බදු නිදහස් කිරීමේ කාල සීමාවන් ගණනය කිරීමේ දී, යම් තක්සේරු වර්ෂයක දී සිදු කරන ලද ගනුදෙනුවලින් ඒ ව්‍යවසාය ලාභ ලැබීම (ඒ ව්‍යාපාරයේ තක්සේරු කළ හැකි ආදායම) ආරම්භ කරන්නේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ සිට හෝ ඒ ව්‍යවසාය වාණිජ මෙහෙයුම් කරගෙන යාම ආරම්භ කරන්නේ යම් දිනයක දී ද ඒ දිනයේ සිට ගණනය කළ යුතු ඒ ව්‍යවසාය වසර දෙකක කාල සීමාවක් සම්පූර්ණ කරන්නා වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට, යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ගණනය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (1) වන උපඡේදයේ වගුවේ 5 වන පන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පන්තිය එකතු කිරීමෙන්:-

| | |
|---|---|
| "6 | දේශීය දියර කිරි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන නවීන තාක්ෂණයෙන් යුත් කිරි දොවන යන්ත්‍ර."; |

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (3) වන උපඡේදයේ වගුවේ 5 වන පන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පන්තිය එකතු කිරීමෙන්:-

| | |
|---|---|
| "6 | 2"; |

(ආ) ඒ ඡේදයේ (4) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ (ඇ) අයිතමයේ, "වාහනයක්; හෝ" යන වචන වෙනුවට "වාහනයක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ඈ) අයිතමයේ "ට්‍රේලරයක්;" යන වචන වෙනුවට "ට්‍රේලරයක්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ (ඈ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(ඉ) යතුරු පැදියක්,";

(3) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ (3) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(4) (1) වන උපඡේදයේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ දෙවන හෝ හයවන උපලේඛනයේ විධිවිධානවලට අනුකූලව ගණනය කරන ලද වැඩි කළ ප්‍රාග්ධන දීමනා අඩු කිරීමට යටත් වූ තැනැත්තකුගේ ක්ෂය විය හැකි වත්කමක් ඒ තැනැත්තා විසින් උපලබ්ධි කරනු ලබන අවස්ථාවක, වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කරන ලද තක්සේරු කළ හැකි ගාස්තුව, ඒ වත්කම සඳහා තක්සේරු වර්ෂය තුළ දී ඒ තැනැත්තාට ලැබුණු ප්‍රතිෂ්ඨාවට සමාන විය යුතු ය; නැතහොත් ඒ වත්කම වෙනුවෙන් ඒ වර්ෂය සඳහා ඒ තැනැත්තාට කිසිදු තුලනය කිරීමේ දීමනාවක් ප්‍රදානය නොකළ යුතු ය.".

**55.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (ඇ) උපඡේදයේ "1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කරන ලද ලාභ." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒකාබද්ධ අරමුදලට හෝ 1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජනාධිපති අරමුදලට ගෙවන ලද යම් මුදලක්." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (ඇ) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද සහ තහවුරු කර ඇති පරිදි, සමෘද්ධි ප්‍රතිලාභී පවුලක කාන්තාවක් සඳහා වෙළඳසැලක් පිහිටුවීම සඳහා වාසික පුද්ගලයකු විසින් මුදල් හෝ වෙනත් ආකාරයකින් දෙන දායකත්වය;

(ඉ) 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, යම් මූල්‍ය ආයතනයක් විසින් වෙනත් යම් මූල්‍ය ආයතනයක් අත්කර ගැනීමේ පිරිවැය ලෙස හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන වියදම, එක් එක් සිද්ධිය අනුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තහවුරු කරන පරිදි සියලු කරුණු සලකා බැලීමෙන් නිශ්චය කරනු ලබන අවස්ථාවක දී එසේ දරන වියදම; ඒ අඩුකරනු ලැබිය හැකි වියදම, තක්සේරු වර්ෂ තුනකට සමාන ප්‍රමාණවලින් බෙදා වෙන් කළ යුතු අතර, වියදම දරන ලද්දේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයෙන් ආරම්භවන එක් එක් තක්සේරු වර්ෂය තුළ දී ඒ මූල්‍ය ආයතනයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, වසරක් තුළ මුළු තක්සේරු කළ හැකි ආදායම ඉහත අවසරලත් අඩු කිරීම ඉක්මවා නොතිබීම හේතුවෙන්, වසර තුනක කාල සීමාව තුළ අඩු කරනු නොලැබූ යම් මුදලක්, වසර තුනක කාලසීමාවෙන් පසුව ඉක්බිතිවම වූ තක්සේරු වර්ෂයේ දී සහ ඉන්පසු වර්ෂයේ දී යනාදී ලෙස අඩු කරනු ලැබිය යුතු ය;

(ඊ) යම් තැනැත්තකු විසින් 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව-

(i) රුපියල් මිලියන පහකට නොඅඩු පිරිවැයක් (ඒ චිත්‍රපටයේ ප්‍රවර්ධන වියදම් ද ඇතුළුව) දරමින් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමේ දී;

(ii) රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන පිරිවැයක් දරමින් අලුත් සිනමා ශාලාවක් ඉදිකිරීමේ දී සහ ඊට උපකරණ සවිකිරීමේ දී;

(iii) රුපියල් මිලියන දහයක් නොඉක්මවන වියදමක් දරමින් සිනමා ශාලාවක් වැඩිදියුණු කිරීමේ දී,

දරන ලද වියදම:

එසේ වුවද, මේ උපඡේදය යටතේ වූ අඩු කිරීම වර්ෂයේ බදු අයකළ හැකි ආදායමෙන් තුනෙන් එකකට සීමා කළ යුතු අතර, පවත්නා වර්ෂයේ දී අඩු නොකරන ලද යම් මුදලක් ඒ සීමා කිරීමට යටත්ව පසුව එළඹෙන වර්ෂයට හා ඉන්පසු වර්ෂයට යනා දී ලෙස ඉදිරියට ගෙන ගොස් අඩු කරනු ලැබිය හැකි ය.

මේ උපඡේදයේ කාර්යය සඳහා-

"චිත්‍රපටය" යන්නෙන්, ඕනෑම ආකාරයකින් හෝ ආකෘතියකින් නිපදවන ලද සහ ප්‍රධාන වශයෙන් ම සිනමා ශාලාවක තිරයක් මත ප්‍රක්ෂේපණය කිරීමෙන් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන චලනය වන රූපවල යම් ශ්‍රව්‍ය-දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් අදහස් වේ; සහ

1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සිනමා ශාලාවක් ඉදිකිරීම, උපකරණ සවිකිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වන වියදම් සහ එය ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් රඟහල පද්ධති සහ ඩොල්බි ශබ්ද පද්ධතිවලින් සමන්විත බවට සහතික කරනු ලැබිය යුතු ය.";

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (අ) උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) (i) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 500,000 ක්; සහ

(ii) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 3,000,000 ක්,

එහෙත්, භාරකරුවකු, භාරගැනුම්කරුවකු, පොල්මංකරුවකු හෝ ඇවරකරුවකු වන යම් පුද්ගලයකු ඒ භාරකරු, භාරගැනුම්කරු, පොල්මංකරු හෝ ඇවරකරු වශයෙන් ඒ පෞද්ගලික සහනය අඩු කිරීම සඳහා හිමිකම් නොලැබිය යුතු අතර, ආයෝජනය උපලබ්ධි කිරීමෙන් වන ලැබීම්වලින් ඒ සහනය අඩු නො කළ යුතු ය;";

(ආ) ඒ ඡේදයේ (ආ) උපඡේදයේ "එක් එක් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (ඇ) උපඡේදයේ "වර්ෂය සඳහා" යන වචන වෙනුවට "2019 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ ඡේදයේ (ඉ) උපඡේදයේ "වර්ෂය සඳහා" යන වචන වෙනුවට "2019 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ ඡේදයේ (ඉ) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේද එකතු කිරීමෙන්:-

"(ඊ) වාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා දරන ලද පහත දැක්වෙන වියදම්:-

(i) වෛද්‍ය රක්ෂණය සඳහා වන දායක මුදල් ඇතුළු සෞඛ්‍ය වියදම්;

(ii) ඒ පුද්ගලයා වෙනුවෙන් හෝ ඒ පුද්ගලයාගේ දරුවන් වෙනුවෙන් දේශීයව දරන ලද වෘත්තීය අධ්‍යාපන හෝ වෙනත් අධ්‍යාපනික වියදම්;

(iii) නිවාස ණය සම්බන්ධයෙන් ගෙවන ලද පොලිය;

(iv) සේවායෝජකයකු යටතේ වූ හෝ සේවායෝජකයකු වෙනුවෙන් වූ විශ්‍රාම යෝජනා ක්‍රමයකට සේවානියුක්තියකු විසින් ගෙවනු ලබන දායක මුදල් හැර යම් දේශීය විශ්‍රාම යෝජනා ක්‍රමයකට සේවානියුක්තයකු විසින් ගෙවන ලද දායක මුදල්;

(v) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොටස් හෝ වෙනත් යම් මූල්‍ය සාධන පත්‍ර මිල දී ගැනීම සඳහා හෝ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ භාණ්ඩාගාර බැඳුම්කර හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම සඳහා දරන ලද වියදම්;

(උ) ස්වකීය පරිශ්‍රයෙහි සවි කිරීම පිණිස සූර්ය පැනල අත්කර ගෙන එය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලද වාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ සූර්ය පැනල සඳහා වූ සම්පූර්ණ වියදම තෙක් හෝ ඒ සූර්ය පැනල අත්කර ගැනීමට ලබා ගත් යම් ණය මුදලක් සම්බන්ධයෙන් බැංකුවකට ගෙවන ලද මුදල් ප්‍රමාණය තෙක්, එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 600,000.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම

**56.** ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 2 වන ඡේදය ඉවත් කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ "වසර තුනකට පසු" යන වචන වෙනුවට "වසර හයකට පසු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ 8 වන ඡේදයේ "තක්සේරු වර්ෂ තුනක් සඳහා" යන වචන වෙනුවට "තක්සේරු වර්ෂ පහක කාලසීමාවක් තුළ" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ 8 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

**"පොලී අනුපාතිකය**

9. 159 වන වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2020 මාර්තු මස 1 වන දින සිට 2020 සැප්තැම්බර් මස 30 වන දින දක්වා වූ කාලසීමාව සඳහා මේ පනත යටතේ නියමිත සහ ගෙවිය යුතු යම් ගෙවීමක් සඳහා වන පොලී අනුපාතිකය ශුන්‍යය විය යුතු ය.

**අලෙවිකරණ සහ සන්නිවේදන වියදම්**

10. (1) (2) වන උපඡේදයට යටත්ව, යම් තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාරයෙන් ලැබුණු ආදායම ගණනය කිරීමේ දී, 15අ වගන්තිය යටතේ අඩු කරන ලද අලෙවිකරණ සහ සන්නිවේදන වියදම්වල මුළු වටිනාකමෙන් 100% කට සමාන අතිරේක අඩුකිරීමකට ඒ තැනැත්තා 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ තුන තුළ හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපඡේදය යටතේ වන අතිරේක අඩු කිරීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබිය යුතු ය:-

(අ) ඒ ගෙවීම, බදු ගෙවන්නාගේ ආශ්‍රිත තැනැත්තකු නොවන තැනැත්තකුට කරනු ලැබිය යුතු ය;

(ආ) අභ්‍යන්තර අලෙවිකරණ වියදම්, අලෙවිකරණ කාර්ය මණ්ඩලයේ වැටුප්, අභ්‍යන්තර අලෙවිකරණ දෙපාර්තමේන්තුවක් පවත්වා ගෙන යාමේ වියදම්, සංස්ථාපිත සමාජයීය වගකීම පිළිබඳ කටයුතුවල දී දරන ලද වියදම් සහ විදේශ ගමන් වියදම් (1) වන උපඡේදය යටතේ අතිරේක අඩු කිරීම හා සම්බන්ධ කාර්යය සඳහා සලකා බලනු නොලැබිය යුතු ය;

(ඇ) ඒ වියදම, ගණනය කිරීමේ පදනම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු, 65% ක දේශීය අගය එකතු කිරීමක් සහිත භාණ්ඩවලට සහ සේවාවලට ආරෝපණය කළ හැකි විය යුතු ය;

(ඈ) (1) වන උපඡේදය යටතේ මුළු අතිරේක අඩු කිරීම යම් තක්සේරු වර්ෂයක් සඳහා රු. 500,000,000 ක් නොඉක්මවිය යුතු ය;

(ඉ) මේ පනතේ වෙනත් වගන්තිවල අවශ්‍යතාවයන්ට අමතරව, කොමසාරිස් ජනරාල්වරයා විසින් (1) වන උපඡේදයේ කාර්යය සඳහා, වාර්තා, මුලාශ්‍ර ලියවිලි සහ ආශ්‍රිත ලියවිලි පවත්වා ගෙන යාම පිළිබඳ අවශ්‍යතා නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

**මූල්‍ය පිරිවැය**

11. මේ පනතේ විධිවිධානවලට යටත්ව, 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ දී දරන ලද (පෙර වර්ෂවල දී අඩු කරනු ලැබීමට ඉඩ නොදුන් ප්‍රමාණ හැර) මූල්‍ය පිරිවැය 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සීමාව කුමක්

වුව ද, අඩු කරනු ලැබිය යුතු ය. ඒ තක්සේරු වර්ෂය, 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සය අවුරුදු කාලසීමාවේ කාර්යය සඳහා සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය.”.

නිශ්චිත කාලසීමා සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට ඇති බලතල

**57.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, අවශ්‍ය විය හැකි පරිදි, 2020 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීමේ කාර්යය සඳහා, එක් එක් ප්‍රභවයෙන් වන තක්සේරු කළ හැකි ආදායම (හෝ අලාභ) ගණනය කිරීම, සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩුකිරීම, බදු අය කළ හැකි ආදායම ගණනය කිරීම, අවස්ථාවෝචිත පරිදි, 2019 අප්‍රේල් මස 1 වන දින සිට 2019 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ පළමු කාලසීමාව සඳහා සහ 2020 ජනවාරි මස 1 වන දින සිට 2020 මාර්තු මස 31 වන දින දක්වා වූ දෙවන කාලසීමාව සඳහා යන තක්සේරු වර්ෂ කාලසීමා දෙක සම්බන්ධයෙන් සමානුපාතික පදනම හෝ තථ්‍ය පදනම අදාළ කර ගැනීම අවශ්‍ය වන්නා වූ අවස්ථානුගත කරුණු හා ඒ හා සම්බන්ධ බදු අනුප්‍රමාණ සහ බදු බැර නිශ්චිතව දක්වමින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

පශ්චාත් කෝවිඩ් 19 (Covid 19) ආර්ථික ප්‍රගතිය උදෙසා පහසුකම් සැලසීම සඳහා වූ බදු සහන පිළිබඳ ක්‍රියාමාර්ග

**58.** (1) 2019 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි යම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් විසින් ගෙවිය යුතු වූ ද, කොමසාරිස් ජනරාල්වරයාගේ වාර්තාවල 2020 ජුනි මස 26 වන දින වන විට හිඟව පවතින්නා වූ ද, යම් හිඟ ආදායම් බදු මුදලක්, 2019 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන තක්සේරු වර්ෂය දක්වා (වාර්තාව අනුව බදු ගෙවීම සඳහා කරන ලද තක්සේරු හැර, එහෙත් යම් දණ්ඩන මුදලක් ඇතුළුව) කරන ලද යම් තක්සේරුවක් හේතුවෙන් ඒ හිඟ බදු මුදල පැන නැගී ඇත්නම් සහ-

(අ) ඒ තක්සේරුව මේ පනතේ විධිවිධාන හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව සිදු කර ඇත්නම්; එහෙත්,

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් බදු පනතක විධිවිධාන සලසා ඇති පරිදි, ඒ තැනැත්තා විසින් නිසි පරිදි ඉල්ලා සිටින යම් ආපසු ගෙවීමක් ඒ හිඟ ආදායම් බදු මුදල්වලින් අඩුකිරීමකට යටත්ව,

කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ හිඟ ආදායම් බදු මුදල කපා හැරිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියට යටත්ව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් විසින් ආදායම හෝ යම් අඩුකිරීමක් හෝ සහනයක් පිළිබඳ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් කිසිදු වංචාවක් හෝ සිතාමතා පැහැර හැරීමක් සිදු කර නොමැති බවට සහ වාර්තාවේ ප්‍රකාශ කර ඇති බද්ද ගෙවා ඇති බවට සහකාර කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, ඒ සහකාර කොමසාරිස්වරයා විසින් 2020 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ විධිවිධාන යටතේ ස්වයං තක්සේරුව සංශෝධනය කිරීම නොකළ යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) 2019 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සිය ආදායම් වාර්තාව, 2021 ජූනි මස 30 වන දිනට පෙරාතුව ගොනු කරන; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් තක්සේරු කිරීම මත, 2019 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද 2021 ජූනි මස 30 වන දිනට පෙරාතුව ගෙවන,

යම් තැනැත්තකුට එරෙහිව දණ්ඩනයක් පැනවීම හෝ ප්‍රධාන ප්‍රඥප්තියේ XVIII වන පරිච්ඡේදය යටතේ යම් අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම නොකළ යුතු ය.

අතීතයට බලපෑම

**59.** මේ සංශෝධන පනතේ දක්වා ඇති 'ආ' වගුවේ I වන තීරයේ නිශ්චිතව සඳහන් වගන්ති මගින් ඒ වගුවේ II වන තීරයේ නිශ්චිතව සඳහන් ප්‍රධාන ප්‍රඥප්තියේ අනුරූප වගන්තිවලට සිදු කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා ඒ වගුවේ III වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව සඳහන් දිනවල දී ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

වලංගු කිරීම

**60.** මේ සංශෝධන පනතේ දක්වා ඇති 'ආ' වගුවේ III වන තීරයේ නිශ්චිතව සඳහන් දිනවලින් ආරම්භ වී මේ සංශෝධන පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ මේ සංශෝධන පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ආදායම් බද්ද එකතු කර ඇති යම් තැනැත්තකු, නිසි අධිකාරී බලය ඇතිව කටයුතු කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කරනු ලැබ ඇති බවට සහ වලංගු බවට සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ තැනැත්තා ඒ බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලින් මෙයින් හානිපූරණය කරනු ලබන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**61.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

'අ' වගුව (1වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| මේ පනතේ වගන්ති අංකය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තියේ අංකය |
| 6 | 11 |
| 7 | 14 |
| 8 | 15අ |
| 10 | 18 |
| 11 | 19 |
| 13 | 36 |
| 14 | 38 |
| 17 | 60 |
| 18 | 62 |
| 19(2) | 66(3) |
| 34(2) | 93(3) |
| 36 | 95 |
| 37 | 103 |
| 38 | 113 |
| 39 | 120 |
| 40 | 126 |
| 42(2) සහ 42(3) | 139(5) සහ139(6) |
| 43 | 140 |
| 45(2) | 158(2) |
| 47 | 190අ |
| 48(4),(7)සහ(10) | 195 |
| 51(1) (ඊ) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (5) වන උපඡේදය |
| 51(4)(ඈ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2අ) උපඡේදයේ (ඔ) සහ (ඕ) යන අයිතම |

| *I* වන තීරය | *II* වන තීරය |
|---|---|
| *මේ පනතේ වගන්ති අංකය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තියේ අංකය* |
| 51(4)(ඈ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (5) වන උපඡේදය |
| 51 (9) | පළමුවන උපලේඛනයේ 11 වන ඡේදය |
| 52(1)(ඇ) | දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (9) වන උපඡේදය |
| 52(2) | දෙවන උපලේඛනයේ 2 වන ඡේදය |
| 52(3) | දෙවන උපලේඛනයේ 3 වන ඡේදය |
| 53(2) | තුන්වන උපලේඛනයේ (ඌඌ) ඡේදය |
| 53(3) | තුන්වන උපලේඛනයේ (එ) ඡේදයේ (v) වන සහ (vi) වන උපඡේද |
| 53(5) | තුන්වන උපලේඛනයේ (ඕඕ) සහ (ඕඕඕ) ඡේද |
| 53(9) | තුන්වන උපලේඛනයේ (ඩඩ) ඡේදය |
| 53(10) | තුන්වන උපලේඛනයේ (ද) ඡේදයේ (v) වන සහ (vi) වන උපඡේද සහ (ප) ඡේදය |
| 54(1) | හතරවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1) වන උපඡේදයේ වගුව |
| 54(2)(අ) | හතරවන උපලේඛනයේ 2 වන ඡේදයේ (3) වන උපඡේදයේ වගුව |
| 54(3) | හතරවන උපලේඛනයේ 4 වන ඡේදය |
| 55(1)(ආ) | පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ඈ), (ඉ) සහ (ඊ) උපඡේද |
| 55(2)(ඉ) | පස්වන උපලේඛනයේ 2 වන ඡේදයේ (උ) උපඡේදය |
| 56(4) | හයවන උපලේඛනයේ 10 වන සහ 11 වන ඡේද |

'ආ' වගුව (*59 වන වගන්තිය*)

| *I* වන තීරය | *II* වන තීරය | *III* වන තීරය |
|---|---|---|
| මේ පනතේ වගන්ති අංකය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය ලබන කරනු වගන්තියේ අංකය | ක්‍රියාත්මක වන දිනය |
| 2 | 5 | 01.04.2018 |
| 3 | 6 | 01.04.2018 |
| 4 | 9 | 01.04.2018 |
| 5 | 10 | 01.04.2018 |
| 9 | 16 | 01.04.2018 |
| 12 | 20 | 01.04.2018 |
| 15 | 53 | 01.01.2020 |
| 16 | 55 | 01.01.2020 |
| 19(1) සහ19(3) | 66(2) සහ 66(4) | 01.04.2018 |
| 20 | 68 | 01.04.2018 |
| 21 | 70 | 01.04.2018 |
| 22 | 75 | 01.04.2018 |
| 23 | 76 | 01.04.2018 |
| 24 | 77 | 01.04.2018 |
| 25 | 78 | 01.04.2018 |
| 26 | 83 | 01.04.2020 |
| 27 | 83අ | 01.04.2020 |
| 28 | 84 | 01.01.2020 |
| 29 | 84අ | 01.04.2020 |
| 30 | 85 | 01.01.2020 |
| 31 | 87 | 01.04.2018 |
| 32(1)(ආ) සහ 32(3) | 88 (1)(ඇ) සහ 88(3) | 01.04.2018 |
| 32(1)(අ) සහ 32 (2) | 88(1) සහ 88 (1අ) | 01.01.2020 |

| *I* වන තීරය | *II* වන තීරය | *III* වන තීරය |
|---|---|---|
| මේ පනතේ වගන්ති අංකය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තියේ අංකය | ක්‍රියාත්මක වන දිනය |
| 33(1) සහ 33(2) | 90(1) සහ 90(2) | 01.04.2018 |
| 33(3) සහ 33 (4) | 90(3) සහ 90(5) | 01.04.2020 |
| 34(1) | 93(2) | 01.04.2018 |
| 35 | 94 | 01.04.2019 |
| 41 | 129 | 01.04.2018 |
| 42(1) | 139(3) | 01.04.2018 |
| 44 | 157 | 01.04.2018 |
| 45(1) | 158(1) | 01.04.2018 |
| 46 | 159(1) සහ 159(2) | 01.04.2018 |
| 48(1), (3), (8) සහ (9) | 195 | 01.04.2018 |
| 48(2) | 195 | 01.04.2019 |
| 48(5) | 195 | 01.01.2020 |
| 48(6) | 195 | 01.04.2020 |
| 49 | 201(2)(ආ) | 01.04.2018 |
| 50 | 203 | 01.04.2018 |
| 51(1)(අ), (ආ), (ඇ) සහ (ඈ) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ පිළිවෙලින් (1) වන, (1අ) වන, (2) වන සහ (3) වන උපඡේද | 01.01.2020 |
| 51(2) | පළමුවන උපලේඛනයේ 2 වන ඡේදය | 01.01.2020 |
| 51(3) | පළමුවන උපලේඛනයේ 3 වන ඡේදයේ (1) වන උපඡේදය | 01.01.2020 |
| 51(4)(අ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (1) වන උපඡේදය | 01.01.2020 |
| 51(4)(ආ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2) වන උපඡේදය | 01.01.2020 |

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *මේ පනතේ වගන්ති අංකය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තියේ අංකය* | *ක්‍රියාත්මක වන දිනය* |
| 51(4)(ඇ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2අ) වන උපඡේදය ((ඕ) සහ (ඖ) අයිතම හැර) | 01.01.2020 |
| 51(5)(අ) | පළමුවන උපලේඛනයේ 5 වන ඡේදයේ (1) වන උපඡේදය | 01.01.2020 |
| 51(6) | පළමුවන උපලේඛනයේ 7 වන ඡේදයේ (1) වන සහ (3) වන උපඡේද | 01.01.2020 |
| 51(8) | පළමුවන උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදය | 01.01.2020 |
| 51(1)(ඉ) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදය | 01.04.2019 |
| 51(5)(ආ) | පළමුවන උපලේඛනයේ 5 වන ඡේදයේ (2) වන උපඡේදය | 01.04.2018 |
| 51(7) | පළමුවන උපලේඛනයේ 8 වන ඡේදය | 01.04.2018 |
| 51(9) | පළමුවන උපලේඛනයේ 12 වන ඡේදය | 01.04.2020 |
| 52(1)(අ) සහ (ආ) | දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (2) වන, (3) වන, (4) වන සහ (6) වන උපඡේද | 01.04.2018 |
| 53(1) | තුන්වන උපලේඛනයේ (ඈ) ඡේදය | 01.04.2018 |
| 53(3) | තුන්වන උපලේඛනයේ (එ) ඡේදයේ (i) වන සහ (ii) වන උපඡේද | 01.04.2018 |
| 53(4) | තුන්වන උපලේඛනයේ (ඔ) සහ (ඕ) ඡේද | 01.04.2018 |
| 53(8) | තුන්වන උපලේඛනයේ (ඩ) ඡේදය | 01.04.2018 |
| 53(10) | තුන්වන උපලේඛනයේ (ත) ඡේදය | 01.04.2018 |
| 53(3) | තුන්වන උපලේඛනයේ (එ) ඡේදයේ (iii) වන උපඡේදය | 01.01.2020 |

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *මේ පනතේ වගන්ති අංකය* | *ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තියේ අංකය* | *ක්‍රියාත්මක වන දිනය* |
| 53(6) | තුන්වන උපලේඛනයේ (ච) ඡේදය | 01.01.2020 |
| 53(7) | තුන්වන උපලේඛනයේ (චච) ඡේදය | 01.01.2020 |
| 53(10) | තුන්වන උපලේඛනයේ (ද) ඡේදයේ (ii), (iii) සහ (iv) වන උපඡේද | 01.01.2020 |
| 53(10) | තුන්වන උපලේඛනයේ (න) ඡේදය | 01.01.2020 |
| 53(3) | තුන්වන උපලේඛනයේ (ළ) ඡේදයේ (iv) වන උපඡේදය | 08.04.2020 |
| 53(10) | තුන්වන උපලේඛනයේ (ද) ඡේදයේ (i) වන උපඡේදය | 01.04.2019 |
| 54(2)(ආ) | හතරවන උපලේඛනයේ 2 වන ඡේදයේ (4) වන උපඡේදය | 01.04.2018 |
| 55(1)(අ) | පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ඇ) වන උපඡේදය | 01.04.2019 |
| 55(2) | පස්වන උපලේඛනයේ 2 වන ඡේදය ((උ) උපඡේදය හැර ) | 01.01.2020 |
| 56(1),(2)සහ(3) | හයවන උපලේඛනයේ 2 වන, 3 වන සහ 8 වන ඡේද | 01.04.2018 |
| 56 (4) | හයවන උපලේඛනයේ 9 වන ඡේදය | 01.03.2020 |
| 57 | අලුත් වගන්තිය | 01.04.2019 |
| 58 | අලුත් වගන්තිය | 26.06.2020 |